# අසනි

සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

**2022 ජන-පෙබ**
**46 වන කලාපය.**
**රු. 30/=**

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කරන ලදි


ධනපති පංතියට
විකල්පය ලෙස
**වාමාංශික පෙරමුණ**
**ගොඩනගමු..!**

# නව වසරේ අර්බුදය තීව්‍ර කරයි..!

**රාජපක්ෂ පවුල් පාලනය විසින් ගෙවී ගිය වසර රට බරපතල අගාධයකට ඇද දැමීමට කටයුතු කළේය. එවන් ව්‍යසනයක් තුළ නව වසර පිළිබඳව බලාපොරොත්තු තබන ලෙස පාලකයින් ජනතාවගෙන් ඉල්ලා සිටිති. ආණ්ඩුවේ නිරුවත හෙළිදරව් වී ඇති පසුබිමක නැවත බලාපොරොත්තු තබාගැනීමට තරම් ජනතාව මන්දබුද්ධික නොවන බව පාලකයින් තේරුම් ගත යුතුව තිබේ.**

**පසුගිය වසර දෙක ගෙවී ගිය ආකාරය පිළිබඳ අවධිමත් ජනතාවට බොහෝ අත්දැකීම් තිබේ. 'මම තමයි හොඳට කරේ' පසුගිය වසර වලදී ජනාධිපතිවරයා ගේ පුරසාරම් කථා මේ වන විට රෙද්ද පල්ලමෙන් බේරමින් තිබේ. 2020 - 2021 කොවිඩ් වසංගතය නිසා ජනතාවට දුක්විඳින්නට වූවත් 2022 එසේ නොවන බවද කියා සිටී. මේ සුරංගනා කථා වලට ජනතාව නොරැවටෙනු ඇත. වත්මන් රාජපක්ෂ පාලනය අවුල් ජාලාවකට මුහුණ දෙමින් සිටින බව ජනතාව තේරුම් ගණිමින් තිබේ. එන්න එන්නම අවුල වැඩිවෙනවා මිස කිසිම අඩුවක් නොවන බව පෙනේ. මේ වන විට රටපුරා අවුල පැතිරී ගියා මිස, එයින් ගැලවුන තැනක් සොයා ගැනීමට නොහැකි විය.**

**ඒ බොහෝ අවුල් වලින් වැඩි ප්‍රමාණයක් කොවිඩ් වලට පරිබාහිරව ඇති වූවාවේ. බොහෝ අවුල් පාලකයින් විසින් හදාගත් ඒවා විය. ඒවාට වගකිව යුත්තේ ජනාධිපති, අගමැති, ඇමැතිවරුන් සහ සියළු රාජ්‍ය නිලධාරීන් ය.**

**ජනතාවගේ භාරකරුවන් හැටියට පත්කරන ලද පාලකයින්ට හෙට විය හැකි ව්‍යසනය තේරුම් ගැනීමට නොහැකි විය. 2022 වසරට පා තබන විට බුද්ධිමත් ජනතාවගේ ඒකමතික තීරණය වී ඇත්තේ, මේ භාරකරුවන්ට වගකීම් ඉටුකිරීමට නොහැකි වී ඇති බවය. මේ පාලකයින් පිළිබඳ විශ්වාසය තබා ඇත්තේ ඔවුන්ගේ වහලුන් මෙන් ඔවුන්ගෙන් තොර ලෝකයක් ගැන සිතන්නට, දකින්නට හැකියාවක් නොමැති අඩුදියුණු සුළුතර ජන පිරිසකටය.**

**මේ ව්‍යසනයේ කෙලවර අතිශය භයානක බව පෙනී ගොස් තිබේ. 2022 අප්‍රේල් - මැයි මස වන විට රටේ සාගතයක් ඇත් විය හැකි බව ධනපති වියතුන්ම ප්‍රකාශ කරමින් සිටී. ජීවන වියදම නිසා හිඟමනට වැටෙන ජන පිරිස වැඩි වනු ඇත. ජීවත් වීමට දුක් විඳින මිනිස්සු, පාලකයින් ගේ වරදින් මැරෙන එක ගැන වගේ වගක් නැත. හොද්දක් බතක් උයන්නට මුළුතැන්ගෙට යෑම මාරයා වෙත ගමන් කිරීමක් වී තිබේ. මේ තත්ත්වය ඇති වූයේ හොරකම වෙනුවෙන් ප්‍රමිතිය වෙනස් කළ නිසාය. කුස ගින්නේ සිටින ජනතාව මරණ බියට ඇද දා තිබේ. මෙවන් ඛේදජනක ඉරණමකට මුහුණ දී සිටින ජනතාවගේ විරෝධය මුළු සමාජයම වෙලාගත් දැවැන්ත විරෝධයක් බවට පත්වන දිනය වැඩි ඈතක නොවේ. එම ජනතා විරෝධයට නායකත්වය ලබාදිය හැක්කේ වාමාංශික හා ප්‍රගතිශීලී බලවේග වලට පමණි.** ■



## වෛද්‍ය සාෆි ට එරෙහි ව කළ චෝදනා ප්‍රලාපයක් බව හෙළිවෙයි..

වෛද්‍ය මොහොමඩ් සාෆි සිනාබ්දින් කාන්තාවන්ගේ පැලෝපිය නාල අවහිර කර නිති විරෝධි ලෙස වන්ධ්‍යාකරණය කරන බව මාධ්‍ය විසින් විශාල ප්‍රචාරණයක් ලබා දීමට කටයුතු කළේය. 2019 වර්ෂයේ දී ඔහුට එරෙහි ඉදිරිපත් කළ මේ චෝදනා හේතු කොටගෙන කුරුණෑගල මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කිරීමට කටයුතු කළේය. එහිදි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඔහු නිදොස් බව තිරණය කරනු ලැබී ම නිසා ඇපමත මුදා හැරීමට අධිකරණය තින්දු කරන ලදි.

සාෆි ඇප මත මුදාහැරීමට කටයුතු කරනු ලැබුවත් රතන හිමි සහ විමල් වීරවංශ වැනි ජාතිවාදී බලවේග සිංහල ජනතාව කුපිත කිරීම සඳහා මේ ප්‍රචාරය නොකඩවා ඉදිරියට ගෙන ගිය බව දක්නට ලැබුණි. එවකට පැවති මැතිවරණ වලදී ද මුස්ලිම් ජනතාවට එරෙහිව සිංහල ජනතාවගේ ඡන්ද ලබා ගැනිමට මේ බොරු ප්‍රචාර සමාජ ගත කිරීමට කටයුතු කරනු ලැබුණි. මෙහි දී ගලගොඩ අත්තේ ඥාණසාර වැනි භික්ෂුන් කියා සිටියේ ඔවුන් මේ අනතුරු ඇඟවීම වසර ගණනාවක් පුරා කළ බවය. මේ සියලු අභූත චෝදනා මේ වන විට ප්‍රතික්ෂේප වී ඇත්තේ සාෆි වෛද්‍යවරයා නැවත සේවයේ පිහිටුවීමට සෞඛ්‍ය අමාත්‍යංශය තිරණය කිරීමත් සමඟය. ■

## ඡන්දය කල්දැම්මේ, පරාජයට බියවෙළා..?

පෙබරවාරි මාසයේ පැවැත්වීමට නියමිතව තිබු ප්‍රාදේශිය සභා ඡන්දය වසරකින් කල් දැමීමට ආණ්ඩුව තීරණය කර තිබේ. මෙලෙස ඡණ්දය කල් දැමීමට හේතු වුයේ කොවිඩ් වසංගතය නිසා බවට කරන ලද ප්‍රකාශවල කිසිදු වලංගුතාවයක් නොමැති වන්නේ රටපුරා රැස්වීම්, සංගීත ප්‍රදර්ශන හා උත්සව පැවැත්වීමට අවසරදි ඇති නිසාය.

එවන් තත්ත්වයක් තුළ ඡන්දය කල් දැමීම පාලකයින්ගේ බංකොලොත්කම එළිපිට ප්‍රදර්ශනය කිරීමකි.

ඡන්දය කල් දැමීමේ ඇත්ත හේතුව වී ඇත්තේ රටපුරා ආණ්ඩුවට එරෙහිව මතුවන දැවැන්ත ජනතා විරෝධය නිසා බව වසන් කිරීමට නොහැකි වී තිබේ. ආණ්ඩුවට ලැබුණු 69 ලක්ෂයේ ඡන්දය පදනම සෝදා පාලුවට ලක්වීම දිනෙන් දින දකින්නට හැකි වී ඇති අතර නැවත පොහොට්ටුවට ඡන්දය දෙන ලෙස ඉල්ලා සිටීමට රාජපක්ෂ පාලනයට සදාචාරාත්මක අයිතියක් නැත.

මෙලෙස ප්‍රාදේශීය සභා මැතිවරණය කල්දැමීම සිදුකර ඇති අතර පළාත් සභා මැතිවරණයට අද නොවෙයි හෙට යන බාලගිරි දෝෂය බවට පත් වී තිබේ. නියමිත කාලයට ඡන්ද පවත්වන බවට රාජපක්ෂවරුන් කරනු ලැබු පුරාජේරු කතා මේ නිසා ප්‍රෝඩාවක් වි ඇත. කෙළවරක් නොමැති අර්බුදය හමුවේ මැතිවරණ සිතියම හකුළුවා දැම්මේ අනතුරක් මේ මඟින් දකින්නට නැ. මෙයට හේතු වන්නේ ඡන්දය පැවැත්වීමට රාජපක්ෂ පාලනය බියට පත්වී ඇති නිසාය. ■

# අපි යන්නේ කොයි පාරේ..

## අපි යන්නේ මග පාරේ...

බණ්ඩාර

කුඹුරේ කැත්ත උදැල්ල අතින් ගත් ශ්‍රී ලාංකික ගොවි මහතුන් අද ආවේගශීලිව ඔවුන්ගේ අදෝනාවන් දිග හරිමින් සිටියි. කැත්ත උදැල්ල පසෙකට විසි කොට සටනපාඨ පුවරු බැනර් ඔසවාගෙන යන්න ඔවුන් විසින්ම තීරණය කලේ ඇයි ද ? මෙය දැන් මුළු රටම බලාසිටි. කඳුළු හංගාගෙන දහඩිය වගුරවමින් අහිංසක ජීවිතයක් ගත කළ ඔවුන් කිසිම දිනක මෙලෙස හැසිරුනේ නැත. ඔවුනට ඇති බිය තුලින් හුරු පුරුදු ජීවන රටාව කනපිට හරවන තීන්දු තීරණ බලධාරයන් පුරුදු ජීවන රාටව කනපිට හරවන තීන්දු තීරණ බලධාරීන් ගත් නිසාවෙන් ඒ ඉතාම සාධාරණ තීන්දුවකි. කණකර උගස කර කුඹුරට බසින ගොවියාගේ එක කන්නයක් වැරදුනොත් එය නැවත සකසා ගැනීඹට ඔවුනට හකිවේද යන්නත් ගැටලුවකි. යාන්තම් තම ජීවිතය ගැටගසා ගැන්මට තම පවුල නඩත්තු කිරීමට ආදායම් ලබන්නේ මාස 6කෙට එක් වරකි. එයත් අවිනිශ්චිතය. ඔවුන්ගේ එක් පුරුකක් වන මම හිටපු ගොවි සංවිධානයක සභාපතිවරයෙක්මි. උදැල්ල පසෙක තබා පෑන හුරු නැතත් මා දරන මේ වෑයම සියලු ගොවි සහෝදර සහෝදරියන්ට උපහාරයක් වේවා.

මඩ සෝදාගත් කළ ගොවියා රජකමට සුදුසුයි. යන පැරණි කියමන හෙට දවසේ වලංගු නොවනු ඇත. ඒ ඔවුනට හුරු පුරුදු ගොවිතැන ඔවුනට අහිමි වන තැනට පාර කපමින් තිබෙන නිසාවෙනි. ප්‍රායෝගික ගොවිතැනෙහි අවුරුදු 60කට වැඩි අත්දැකීම් ඇති මා දන්නා තරමින් කන්නයම කාබනික පොහොර මතට යෑමෙන් පවුල් කඩත්තු කිරීමටත් ර සහලින් ස්වයං පෝෂිත කිරීමටත් නොහැකි වනු ඇත.

බඩගින්න නිවාගැනිමට බත් ටිකක්, පාන් පෙත්තක් පමණක් ලබාදී නිරෝගි දරුවෙකු බලාපොරොත්තු විය නොහැකිය ඔහුට පෝෂදායි ආහාර වේලක් දිය යුතුය. එසේ නොවුන හොත් ඔහු මන්දපෝෂණ දරුවෙකි. ගොයම් පැලයකට වේවා වෙනත් පැලයකට වේවා නිසි මුලික පොහොර සහ අවශ්‍ය මුලද්‍රව්‍ය ලබා නොදුනහොත් එල දරන නිරෝගී පැලයක් බලාපොරොත් විය හැකිද ? මා වී වගාව ගැන කතා කරන්නම්.

නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් අනුපාත මිශ්‍රණයක් ගොයම් පැලයට මුලදීම අත්‍යඅවශ්‍ය වේ. එය ලැබෙන්නේ නම් කෘෂි පර්යේෂණ නිලධාරීන්, ආචාර්ය මහාචාර්යවරුන් තහවුරුකර ඇත. ක්ෂේත්‍ර නිලධාරීන් මගින් අවුරුදු ගණනාවක් පුරාවට අපද දැනුවත් වී ඇත. වර්ධන අවදියේදී නයිට්‍රජන්, පෙටෑසියම් මිශ්‍රණය යෙදිය යුතු වේ. තවද පාලනය කල නොහැකි දිලීර රෝග යන කෘමි නාශක සඳහා අත්‍යවශ්‍ය කෘමිනාශක අවශ්‍ය වේ. තෝරා නසන වල් නාශක ආරම්භක අවධියේදී අත්‍යවශ්‍ය වේ. වී ගොවිතැන මෙන්ම එලවලු, පළතුරු, තේ වැනි බෝග සඳහා ද මෙලෙසින් සුදුසු පොහොර , තෙල් වැනි දෑ අවශ්‍ය වේ.

කාබනික පොහොර අවශ්‍ය නමුත් එය එකවර හිටි හැටියේම යෝජනා කර බලගැන්වීම තකතීරු ක්‍රියාවකි. නිවැරදි කාබනික පොහොරක් සාදාගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙල අදියරෙන් අදියරට බලගැන්විය යුතුය. කාබනික පොහොර සමඟ අවශ්‍ය අනෙකුත් මුලද්‍රව්‍ය ($N_2$, $P_2O_3$,$K_2$) යන අංශූ මාත්‍රා, මුලද්‍රව්‍ය වගාවට යොසන වැඩ පිළිවෙල ප්‍රායෝගිකව ගොවීන් සමඟ එකතුවී සාකච්ඡා කල යුතුයි. එසේ නොමැතිව ආදායම් ලැබිය හැකි නිරෝගී පැලයක් ලබාගත හැකිද යන්න බලධරයින්ට නොතේරීම කනගාටුවකි.

පලිබෝධ මර්දනය කිරීම තවත් වැදගත් අවශ්‍යම පියවරකි. දිලීර රෝග සහ බරපතල කෘමි හානි සඳහා ඒ ඒ අවස්ථාවලදී ක්‍රියාත්මක නොවුන හොත් පිලියම් නොයෙදුව හොත් මුලු වගාවටම ආයුබෝවන කියා ගොවියාට කන්න අවසානයේ කදුලු වගුරන්නට සිදුවෙමි. මෙය සමස්ත ගොවියන් ප්‍රායෝගිකව ගත් අත්දැකීම්ය.

පොඩි උදාහරණයක් කියන්නම් කොපු මයිටා රෝගය එයට නිසි අවස්ථාවේදී අවශ්‍ය කෘමිනාශක යෙදීම නොකලහොත් කුඹුරේ ආදායම නොලැබී යාමට උවද බැරිනැත. මේ අයුරින්ම කීඩෑ උවදුර ද භයානක කෘමි හානියකි.

අද දවසේ වෙළඳපොලින් පොහොර සහ කෘමිනාශක සොයා ගැනීමට ඉතාම අසීරුය. නැතිතරම්ය. තිබනත් ගොවියාට මිලදී ගැනීමට නොහැකි තරමේ මිල ගණන්ය. මේ නිසාවෙන් ගොවි මහතුන් පාරට බැස්සා යයි කීමට වඩා පාලකයින් විසින් පාරට ඇද දැමුවායැයි කීම වඩා නිවැරදිය.

වී ගොවියාට අමතරව අපි ගෙවත්තේ අතිරේක බෝග වගා කරන්නෙමු. එම වගාවන්ටද අත්වී ඇති ඉරණමද වෙනසක් නැත.

කෙසේ හෝ වේවා මට හිතෙන විදිහට ඉදිරියේදී අප රටට කෘෂිකර්මාන්තයක් පිළිබඳ දැනුම ඇති ආචාර්ය මහාචාර්යවරුන් පර්යේෂකයින් විශේෂ දැනුම ඇති නිලධාරීන් අවශ්‍ය නොවේ. තක තීරු තීන්දු ගන්නා බලධරයින් සිටීම ප්‍රමාණවත්ය. ගොවි බිම ගැන අත්දැකීම් ඇති අයගේ උපදෙස් අවශ්‍ය නොවනු ඇත. රට සහලින් වෙතත් ස්වයංපෝෂණය නොව සාගතයකින් වෙලා ගැනීමට පාර කපමින් සිටි.

ඉතිං ආයුබෝවන් ලක් මවුනි අපට සමාවන්න. අපි හිතාමතා ඔබට ද්‍රෝහී වුවා නොවේ. මේ සුන්දර දිවයින පෝෂණය කළාවූ අපේ ගොවි රජවරුන්ගේ මල ගමට බලධරයින් පාර කපා ඇත. සුසානය වෙත ගෙනයාමට පෙර බලධරයින්ගේ ඇස් විවර වේවා, කන් ඇසේවා!. බුද්ධිය පහල වේවා!!.■




# වම ස්වාධීන කරගැනීමේ අභියෝගය..

70 දශකයේ අවසාන භාගයේ වම ස්වාධින කර ගැනීමට නව සමාජ පක්‍ෂය ගත් උත්සාහය මේ වනවිට එම නායකත්වය විසින් කරනු ලැබු පාවාදීම් නිසා විනාශවී තිබේ. ඔවුන් අද ධනපති පක්‍ෂ වල සෘජු එජන්තයින් බවට පත්වී ම නිසා න. ස. ස. ප. වටා සිටි බොහෝ සාමාජිකයින් අතරමං වී තිබේ. එම ඉතිහාසයේ නසසප නායකතවයේ නිර්මාක්ස්වාදී දේශපාලනයට එරෙහි මාක්ස්වාදයේ ආරක්‍ෂාව වෙනුවෙන් පෙනී සිටි ක්‍රියාදරයන් විසින් ධනපති පංතිය සමඟ පංති සහයෝගතා දේශපාලනයට එරෙහි ආරම්භ කරන ලැබු ගැඹුරු දේශපාලන න්‍යායික කතිකාවන්ගේ ප්‍රතිඵලයක් ලෙස විප්ලවකාරී සමාජවාදි බලයක් ගොඩ නැගීමේ අඩිතාලම දැමීමට තීන්දු කරනු ලැබීය. වත්මන් දේශපාලන පසුබිම තුළ නැවත වම ස්වාධීන කරගැනිමේ එකම මාවත ලෙස එය සනිටුහන් කරමු. මෙම කතිකාවත ඉදිරියට ගෙන යමින් හවුල් ආණ්ඩු දේශපාලනයට හා ගෝලිය ධනවාදයට ජාතිවාදයට එරෙහි පෙනී සිටින පක්‍ෂ හා සංවිධාන එකතු කරගැනීමේ අඛණ්ඩ උත්සහාය පෙරට ගෙනයාම අපගේ මුලික ඉලක්කය බවට පත් කර ගැනිම ධනපති පන්ති දේශපාලනයෙන් වම ස්වාධින කර ගැනිමේ අරමුණ වේ.

ඉතිහාසයේ අන්කවරදාකටත් වඩා ධනපති ක්‍රමය කඩා වැටෙමින් තිබෙන නිසා ධනපති පක්‍ෂවලට වත්මන් අර්බුදයට විසඳුම් ඉදිරිපත් කිරිමට නොහැකි බව විද්‍යාමාන වෙමින් තිබේ. නව වාමාංශික බලයක් ගොඩ නැගීමට විශාල සමාජ අවකාශයක් මේ වන විට මතු වෙමින් තිබේ. එම අභියෝගය ජය ගැනිම සඳහා අප සියලු වාමාංශික ක්‍රියා දරන හා කණ්ඩායම් එකතු කර ගත යුතුව තිබේ. ඔවුන් පරිනත නායකයන් බවට පත්විය යුතු ය. අපගේ වගකිම සමාජයේ කම්කරු පංතිය ඇතුළු සෙසු පීඩිත ජනතාවට මඟ පෙන්විය හැකි නායකත්වයක් ලෙස ඉදිරියට පැමිණීමට කටයුතු කිරීම ය. මේ පවතින අර්බුදය තුළ සටන් කරන ගොවීන්, කම්කරුවන්, තරුණයන්ගේ සටන් සමග බද්ධ වෙමින් ඉදිරියට යාම වම ස්වාධිනව ගොඩනගීමේ එකම මාවත බවට පත්කර ගත යුතුව තිබේ.■

# පළාත් සභා මැතිවරණය පැවැත්වීමට ඉන්දියාවෙන් තෙරපිමක්

විල්ෆඩ් සිල්වා

ප්‍රසුගිය මාසයේ ඉන්දියානු විදේශ ඇමතිවරයාගේ පැමිණීම සමඟ පළාත් සභා මැතිවරණය පැවැත්වීම ගැන සාකච්ඡාවක් නැවත ඉදිරියට එමින් තිබෙන මාතෘකාවක් වී තිබේ. එල්.ටී.ටී. ව්‍යාපාරය යුදමය වශයෙන් පරාජය කිරීමට ඉන්දියාව ලංකාවේ පාලකයින්ට සහයෝගය ලබාදීමේදී ඇති වූ කොන්දේසියක් ලෙස පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතු බවට යෝජනා වී තිබුණි.මෙයින් ගම්‍ය වන්නේ ඉන්දියාවට ලංකාවේ ජාතික ප්‍රශ්නයට ධනපති සීමාවන් තුළ හෝ විසඳුමක් දීමේ බලාපොරොත්තුව නොවේ. ඉන්දියාවේ කර්මාන්ත හා ආයෝජන ලංකාව තුළ ආරම්භ කිරීම එහි සැඟවී තිබෙන අර්ථය වේ.

ඉහත ගෝලීය ධනපති බලවතුන්ට ලංකාවේ ජාතික ප්‍රශ්නය විසඳා ගැනීමේ බලාපොරොත්තු තිබේ යයි සිතීම මිත්‍යාවකි. මේ පරිසරය උපයෝගී කර ගනිමින් ඔවුන්ගේ කර්මාන්ත ආයෝජන උතුරේ ආරම්භ කිරීම මගින් අධික ලාභ ලැබීම අරමුණ වේ. මෙම අධිරාජ්‍යවාදි උපාය මාර්ගයට ලංකාව මේ වන විට යටත්කර ගනිමින් තිබේ. දිල්ලි පාලකයින් ලංකාවේ උතුරේ නිෂ්පාදන කටයුතු කළහැකි වුවහොත් දකුණු ඉන්දීය සුවිශාල වෙළෙඳ පොළට ලඟාවීමේ අරමුණ විය හැකිය.

අප පෙර සඳහන් කර තිබූ පරිදි රාජපක්ෂ පාලනයට ගෝලීය බලවතුන් සන්තර්පනය විනා ජාතික ප්‍රශ්නයට තාවකාලික හෝ විසඳුමක් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවනු ඇත.ඔවුනගේ දේශපාලන පැවැත්ම රඳා පවතින්නේ සිංහල බෞද්ධ ජාතිවාදී බලවේගවල උවමනාව අනුව කටයුතු කිරීම ය. මේ තත්ත්වය තුළ ඔහු වටා සිටින ජාතිවාදී බලවේග වල අනුකූලත්වය අහිමි වී යනු ඇත. ගෝඨාභය රාජපක්ෂ දිගින් දිගටම කියා සිටියේ ලංකාවේ ජාතික ප්‍රශ්නයක් නොමැති බවත් එයට වෙනත් විසඳුම් අවශ්‍ය නොවන බවත් ය. ඒකීය රාමුව පිළිගනිමින් දෙමළ ජනතාව වැඩකළ යුතු යයි ගෝඨාභය රාජපක්ෂ විවෘතව ප්‍රකාශ කළේය.

පාලකයින්ගේ අත්තනෝමතික ක්‍රියාකාරිත්වය තුළ දෙමළ භාෂාව කතා කරන ජනතාවගේ පීඩනය උතුරු නැගෙනහිර ඉක්මවා දකුණු ඉන්දියාව (තමිල්නාඩු ප්‍රාන්තය) දක්වා ව්‍යාප්ත වීමට විභවයක් මතු වනු ඇත.එම ජනතාවගේ ඉදිරි පීඩනය කුමන සංදර්භයක් තුළ පුපුරා එළියට ඒ දැයි නිගමනය කළ නොහැකිය. එම පීඩනයට පත්වන ජනතාවගේ ඉරණම දකුණේ කම්කරු පීඩිත බලවේග අතර මතුවන විරෝධයන් හා ඒකාබද්ධ කරගනිමින් කටයුතු කළ යුතු බව ශ්‍රී ලංකාවේ කම්කරු පන්ති බලය සැලැස්ම මගින් ඉදිරිපත් කර තිබේ. එකී අවධාරණය මත ලංකාවේ ජාතික ප්‍රශ්නය පිළිබඳ සාකච්ඡාව ඉදිරියට ගත යුතුව තිබේ.■



# ජනතාව කුසගින්නෙන් හා මර බියෙන් පාලකයින්ට සුරසැප..?

ඉතිහාසයේ කිසිදිනයක නොදුටු ලෙස සියලු භාණ්ඩවල මිල ඉහළ යමින් තිබේ. මෙයට ප්‍රධාන හේතුව වන්නේ ආණ්ඩුව කිසිදු සැලැස්මකින් තොරව මුදල් අච්චු ගැසීමය. මේ වනවිට මුදල් අච්චු ගසා ඇති ප්‍රමාණය රුපියල් ට්‍රිලියන දෙක ඉක්මවා යමින් තිබේ. මේ නිසාම උද්ධමන අංකය සියයට 12 ක් බව වාර්තා වේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස දිනපතා ජනතාව පරිභෝජනය කරන බඩුවල මිල ඉහළ යමින් එදිනෙදා ජීවිතය ගැටගසා ගන්නට නොහැකි තත්ත්වයකට පත් වී තිබේ. ගෑස් මිල දෙගුණයක් වැඩි වී ඇති අතර ගෑස් හිඟයකටද මුහුණදීමට සිදුවී ඇත. එම ගෑස් සිලින්ඩරය නිවසට ගෙන ඒමද මරණීය අනතුරකි. ගෑස් වෙනුවට භූමිතෙල් සොයා යන ජනතාවට එය ගැනීමට ද පැය ගණනාවක් පෝලිම්වල සිටීමට සිදු වේ. එක දිනකට 4 දෙනෙක් සිටින පවුලකට ආහාර වේලක් ගැනීමට රු. 1, 000/- කට වඩා වැය වේ. මේ නිසාම බොහෝ දෙනා දිනකට එක ආහාර වේලක් ගැනීමට පුරුදු වී තිබේ. මේ ආහාර වේල සපයා ගැනිමටද උදේ සිට රාත්‍රී කාලය දක්වා ජීවිත සටනක් කිරීමට සිදු වී තිබේ.

මෙවන් සමාජ පසුබිමක් තුළ මැති ඇමතිවරු විදේශ සංචාර සඳහා රුපියල් කෝටි ගණන් වැය කරති. ඔවුනට ජනතාව මුහුණ දෙන මරණීය අභියෝග පිළිබඳ කිසිදු අනුකම්පාවක් නැත. මේ නිසා මතුවන ජනතාවගේ විරෝධය හා වෛර හේතු කොට ගෙන දහස් ගණනක් ජනතාව වීදිවලට එන දිනය වැඩි ඈතක නොවනු ඇත. ■

# 2022 දිග හැරෙන දේශපාලන වර්ධනයන්..



වර්තමාන දේශපාලන දිග හැරුම් වලින් පෙනී යන්නේ මුළු සමාජ පරිසරය ක්ෂණික වෙනස් වීම් වලින් පිරුණු යුගයකට අවතීරණය වෙමින් තිබෙන බවය. ඒ නිසාම ඉදිරි දේශපාලන වර්ධනයන් අතිශය සංකීර්න වනු ඇත

කොරෝනා වසංගතයට පෙර සිටම මතුවූ පවත්නා අර්බුදය මේවනවිට දැවැන්ත ව්‍යවසනයක් කරා දිව යමින් තිබේ. මෙමගින් පාලක පංතියේ අභ්‍යන්තර ප්‍රතිවිරෝධයන් උත්සන්න වෙමින් තිබේ. අර්බුදයෙන් මිදීම සඳහා ඔවුන් අනුගමනය කරන මාවත් සාර්ථක කර ගැනිමට නොහැකි නිසා මෙම ප්‍රතිරෝධයන් උග්‍රවිමට හේතුවි ඇත. අධ්‍යාපන පෞද්ගලික කරණය කිරීමට ගනු ලබන උත්සහයන් අතර කොතලාවල පනතට එරෙහි ශිෂ්‍ය ව්‍යාපාරයේ විරෝධතා කොරෝන වසංගතය තුළ පැනවූ මර්දනයන්ට එරෙහිව ඉදිරියට පැමිණිම නිසා එහි ක්‍රියාකාරකයන් ගණනාවක් මේ වන විටත් සිරගත කර තිබේ. කෘෂිකර්මාන්තයේ දැවැන්ත කඩා වැටිම නිසා ගොවීන්ට පොහොර ලබා දෙන ලෙස කරන උද්ඝෝෂණ රට පුරා ආරම්භ වෙමින් තිබේ. මේ නිසාම ගොවීන් බරපතල ලෙස පීඩාවකට පත් වී තිබේ.

මේ අතර සෞඛ්‍ය සේවකයින් ඇතුළු විවිධ ක්ෂත්‍රයන් තුළ සටන් මතුවීම නිරන්තර දැකිය හැකිවේ. මේ මතුවන සටන් වලින් පෙනියන්නේ සමාජය ගැඹුරු පරිවර්තනයට මග සලකුණු කරන්නක් බව ය.

මේ මතුවන සටන් වලට නායකත්වය ලබා දීමට අවශ්‍ය ඉදිරි දැක්මක් ගොඩනගා ගැනීමට අපි වහාම යොමුවිය යුතුය. මේ තුළ දකින්නට ලැබෙන්නේ පාලකයන්ට අර්බුදය විසදීමට කිසිදු වැඩ පිළිවෙලක් නොමැති බවය. ඉසිරි වර්ෂය ආරම්භ වන්නේ සමස්ත සමාජය පුරා දැවැන්ත ජනතා විරෝධයකට අවශ්‍ය සමාජ පසුබිම නිර්මාණය විමක් ලෙසය. මෙම මතුවන සටන්වලට අපි දේශපාලනික මැදිහත් විය යුතුය. අපගේ සටන්පාඨ සංයුක්තකව ඉදිරිපත් කළ යුතුය. ■

# ව්‍යවස්ථානුකූල ඒකාධිපතිත්වයක අනතුරක්..

විසි වන ව්‍යවස්ථා සංශෝධනය මගින් ගෝඨාභය රාජපක්ෂගේ විධායක බලතල තවදුරටත් තහවුරු කරගැනීමට කටයුතු කළේය. ඔහුගේ බලාපොරොත්තුව දීර්ඝ කාලීන ඒකාධිපති පාලනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ව්‍යුහයක් ගොඩනගා ගැනීමය.එහි පළමු පියවර ලෙස පාර්ලිමේන්තුව හා කැබිනට් මංඩලය අභිබවා හමුදා බලය තහවුරු කරගැනීමය.ප්‍රධාන අමාත්‍යාංශ ගණනාවක බලය ඔහුගේ අණසකට සහ පවුලේ සොහොයුරන්ට ලබාදීමට කටයුතු කිරීමය.මෙම ක්‍රියා කලාපය තුළ රාජපක්ෂ රෙජිමය ශක්තිමත් කර ගැනීම මුලික ඉලක්කය බවට පත් වී තිබේ.ඔහුගේ දේශපාලන අරමුණ ජය ගැනීමට අවශ්‍ය රාජ්‍ය යන්ත්‍රනයේ කොටස්කරුවන් බවට ජාතිවාදි සමාජ බලවේග වල නියෝජිතයින්ට අනුකූලත්වය ලබාදිමට පියවර ගැනිමය. ගලගොඩඅත්තේ ඥාණසාර වැනි නියෝජිතයින්ට කාර්‍ය සාධක බලවේගයේ නායකත්වය ලබා දිම මගින් එය දකින්නට හැකිවේ. විශේෂයෙන්ම මහජන ආරක්ෂක ආඥපනත යටතේ සියළුම දිස්ත්‍රික්ක වල මහජන සාමය පවත්වාගෙන යාමට මුවා වී සන්නද්ධ හමුදා වලට විශේෂ බලතල පැවරීමට නියෝග කිරීමයි.මේ තුළ බොහෝ දිස්ත්‍රික්ක වල මහජන සාමය පවත්වාගෙන යාමට මුවා වී හමුදා වලට බලය පැවරීමට කටයුතු කිරීමයි. මේ අතර ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත ඉවත් කරන බවට ප්‍රකාශ කිරීම මගින් පෙනී යන්නේ ජිනීවා මානව හිමිකම් කොමිෂම රැවටීමට හා GSP ෆල්ස් ලබා ගැනිමේ උත්සාහයක් ලෙසය. යුතුය.■

# එක්සත් පක්ෂයක් ගොඩ නැගීමට බාධකයක් වූ 4 වන ජාත්‍යන්තරය

ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය සහ "වමේ හඬ" සංවිධානය එකතු වී සමාජවාදී ජනතා පක්ෂය නමින් එක්සත් පක්ෂයක් ගොඩ නැගීමට ගත් ප්‍රයත්නය මේ වන විට බිඳ වැටී තිබේ. එම කතිකාව පසුගිය වර්ෂය පුරා ආරම්භ වූ අතර, ඉදිරි සම්මේලනය සඳහා ඉදිරිපත් කරනු ලැබූ ජාත්‍යන්තර ඉදිරි දර්ශනය පිළිබඳව ඇති වූ සංවාදය පදනම් කර ගනිමින් පක්ෂය ගොඩ නැගීමට ගත් උත්සාහයෙන් ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂය ඉවත් වීමට තීරණය කළේ ඇයි ද? යන කරුණු පිළිබඳව සමාජවාදී ජනතා පක්ෂයේ මධ්‍යම කාරක සභිකයින් වෙත යැවූ ලිපිය පහත සඳහන් වේ.

**සමාජවාදි ජනතා පක්ෂයේ මධ්‍යම කාරක සභිකයින් වෙත,**

**ප්‍රිය සහෝදරවරුනි,**

2021.10.14 දින රැස් වූ දේශපාලන මණ්ඩල සකච්ඡාවේදී සමාජවාදි ජනතා පක්ෂයේ පළමු සම්මේලනය සඳහා නීල් සහෝදරයා ලියා තිබූ ජාත්‍යන්තර ඉදිරි දර්ශන යෝජනාවේ සඳහන් වූ 4 වන ජාත්‍යන්තරය මත පදනම් වී ලෝක පක්ෂය ගොඩ නැගිය යුතු යයි යන අවධාරනයට මම අල්විස්, විල්ප්‍රඩ් යන සහෝදරයින්ගේ විරුද්ධත්වය ප්‍රකාශ කරනු ලැබීය. එදින ඉදිරිපත් කරනු ලැබූ මූලික කරුණු මූලික කරුණු වල සංක්ෂිප්තයක් පහත සඳහන් කරමු.

ට්‍රොට්ස්කි සහෝදරයා මිය යාමෙන් පසු 4 වන ජාත්‍යන්තරයට මේ වන විට දශක 7කට ආසන්න වී ඇති බවත්, එම ජාත්‍යන්තරය වර්තමානය වනවිට බිඳ විසිරගොස් පිරිහීම්වලට ලක් වී ඇති බව ය. ට්‍රොට්ස්කි සහෝදරයා ආරම්භ කරනු ලැබූ එම ජාත්‍යන්තරයේ මුල ධාර්මික පදනම් මේ වනවිට දකින්නට නොහැකි වී තිබෙන බව ය. එම ජාත්‍යන්තරය බිඳ වැටීමට සිදුවුයේ 4 වන ජාත්‍යන්තරය නියෝජනය කළ බොහෝ ජාතික ශාඛා සමාජ දේශ ප්‍රේමයට හා ප්‍රතිසංස්කරණවාදයට සහ මාධ්‍යමික වාදයටත් යොමු වූ නිසාය. ඉතිහිසායේ 4 වන ජාත්‍යන්තරය නියෝජනය කළ කිසිදු ශාඛාවකට බහුජන පදනමක් දිනා ගැනීමට නොහැකිවිය. එහි යම් හෝ භූමිකාවක් ඉතිහාසයේ රඟපාන්නට අවස්ථාව ලැබුනේ වියට්නාමයේ, බොලිවියාවේ හා ශ්‍රී ලංකාවේ ගොඩ නගා තිබූ ශාඛා වලටය. ( 1964 ට පෙර ලංකා සම සමාජ පක්ෂය එයට උදාහරණ වේ) ඒ

මෙම පක්ෂ ප්‍රචාරකවාදිව ක්‍රියා කළ විනා කෝඩරගත පක්ෂ බවට පත් වුයේ නැත. එම ශාඛාවලට බොහෝ විට කළ හැකි වුයේ සෝවියට් දේශය පිරිහුණු කම්කරු රාජ්‍යයක් බවත්, එහි නිලධාරිවාදී පිරිහීම් පෙන්වාදීමත්ය. ස්ටැන්ලිවාදයට එරෙහිව යම් හෝ ඓතිහාසික කාර්යය භාරයක් ඔවුන් විසින් කරනු ලැබූ බව පෙනී ගියත්, 1950 පසු මේ කාර්යය භාරයද එලෙස ඉදිරියට ගෙනයන්නට 4 වන ජාත්‍යන්තරයේ බොහෝ ශාඛාවලට නොහැකි වූ බව වර්තමානය වනවිට පෙනී ගොස් ඇත.

මෙම අසාර්ථකත්වයට මුලික හේතුව වුයේ ඔවුන්ගේ වැඩ පිළිවෙලේ අසාර්ථක භාවයයි. දෙවෙනි ලෝක යුද්ධයේ ප්‍රතිඵලයක් ලෙස ඒ වනවිටත්

ට්‍රොට්ස්කිගේ පර්යාවලෝකයන්ට අනුකූල නොවී අපදිශානතව සිටි හතරවන ජාත්‍යන්තරයේ නායකත්වය ස්ටැන්ලිවාදයේ ව්‍යාප්තියට හා නව පිරිහුණු කම්කරු රාජ්‍යයන් සැකසීමට ප්‍රතිචාර දැක් වුයේ ස්ටැන්ලිවාදී විශ්ලේෂණය හා

පක්ෂපාතිත්තයට සමාන කරමින් මොස්කව්වලින් කැඩී වෙන්වීමෙන් ටිටෝ මාධ්‍යමිකයෙකු බවට පත්ව ඇති බවත් ධනේශ්වර දේපළ සබඳතා නිලධාරිවාදී ආකාරයෙන් පෙරළා දැමීම දේශපාලන විප්ලවයක් නොව ප්‍රතිසංස්කරණයන් කළහ.


හතරවෙනි ජාත්‍යන්තරයේ තුන්වන සම්මේලනයේ දී එහි සියලුම ප්‍රධාන නායකයින් විසින් පිළිගන්නා ලද තනි රටක සමාජවාදය පිළිබඳව වැඩපිළිවෙලේ ටිටෝගේ සංස්කරණයට දෙන ලද මෙම

ක්‍රමවේදයම සංශෝධනය කිරීමට ද මාර්ගය විවෘත කළේය. ධනවාදය පෙරළා දැමීමට ස්ටැන්ලිවාදී පක්ෂයක හැකියාව විස්තර කරන ලද්දේ ,විෂයබද්ධ විප්ලවීය ක්‍රියාවලිය, මගින් විප්ලවීය පියවර ගැනීමට එයට බල කරනු ලැබීමේ

පිළිගනු ලැබිණි.

පසුව හතරවන ජාත්‍යන්තරයේ විවිධ නායකයෝ මාඕ සේ තුං, ඩෙන්ශ්ෂියා ඕපිංග් හා හෝ චිං මින් වැනි ස්ටැලිවාදීන් පමණක් නොව සුළු ධනේශ්වර ජාතිකවාදීන් හෝ මිලිටරි ජුන්ටා ඇතුළු විවිධ දේශපාලන ප්‍රවාහයන්ට අනුග්‍රාහකත්වය සැපයුව ද කිසිවෙකු සෝවියට් හවුල තුළ දේශපාලන විප්ලවය පිළිබඳ ට්‍රොට්ස්කිගේ වැඩපිළිවෙල හෝ යටත් විජිත හා අර්ථ විජිත රටවල නොනවතින විප්ලවය නගා ලුවේ නැත.

මෙම පෙරළා දැමීම්වල දී කම්කරු පංතිය භූමිකාවක් රඟපා නොතිබුණ නිසා කිසිදු සමාජ විප්ලවයක්වත් කිසිදු ආකාරයක කම්කරු රාජ්‍යයක්වත් පිහිටුවා නොතිබුණා යයි නිගමනය කළ ජාත්‍යන්තරයේ සුළුතරයක් මගින් මේ හා සමාන මෙන්ම ප්‍රතිවරුද්ධ



# ලෝක පක්ෂයක් ලෙස ඉදිරියට යාමට බාධකයක් වූ 4 වන ජාත්‍යන්තරය පිළිබඳ සාකච්ඡාව..

විප්ලවීය වැඩපිළිවෙල යන දෙකම සංශෝධනය කිරීම මඟින් ය. ස්ටැන්ලිවාදය මොස්කව්වලට ඇති

සඳහා අවශ්‍ය කරන කම්කරු රාජ්‍යයක් ස්ථාපිතකර තිබුණ බවත් ඒ අර්ථයෙන් සෞඛ්‍යමත් කම්කරු රාජ්‍යයක් බිහිව තිබූ බවත් ඔවුහු නිගමනය

අනුග්‍රාකත්වය දේශපාලන විප්ලවය සඳහා වැඩපිළිවෙලේ සම්පූර්ණ පරිමාණ සංශෝධනයට පමණක් නොව සංක්‍රමණික වැඩ පිළිවෙලේ සමස්ත

ප්‍රතිඵලයක් ලෙස ය. අනතුරුව එම ක්‍රියාවලියම අනෙක් නිර්ධන පංති නොවන කාරකයතනවලට ද විප්ලව මෙයෙ වීමට බල කළ හැකිය. යන්න

වරදක් කරනු ලැබීය. ධනවාදය විප්ලවීය ලෙස පෙරළා දැමීමෙහිලා කම්කරු පංතියේ අත්‍යාවශ්‍ය භූමිකාවේ ආරක්ෂණයක් ලෙස

ඉදිරිපත් කළේ වුව ද මෙම ප්‍රාමාණික ක්‍රමවේදය සැබවින්ම ධනවාදය ප්‍රතිවිල්පවීය ලෙස පෙරළා දැමීමක් සිදු විය හැකි බවත් ඒ තුළ සිදු වන්නේ ධනේශ්වර දේපළ සබඳතා පෙරළා දමනු වෙනුවට කම්කරු පංතියට කිසිදු දේශපාලන බලයක් නොදෙනු ලැබීම බවත් යන ට්‍රොට්ස්කිගේ පිළිගැනීම ප්‍රතික්ෂේප කිරීමය. බොල්ටික් රාජ්‍යයන් ආක්‍රමණය කළ සමයේ එවැනි පෙරළා දැමීමක් ට්‍රොට්ස්කි විසින්ම ද දැක තිබුණි. ට්‍රොට්ස්කිගේ විශ්ලේෂණය හා ක්‍රමවේදය ප්‍රතික්ෂේප කිරීම සිදු වුයේ එක්කෝ ටෝනි ක්ලිෆ්ගේ රාජ්‍ය ධනවාදී විශ්ලේෂණයට සමානව ධනවාදය පෙරළා තිබුණෝය යන්න ප්‍රතික්ෂේප කිරීම නැතහොත් ධනවාදයට වඩා තවදුරටත් ප්‍රගතිශීලි නොවූ ,නිලධාරිවාදී සාමුහිකවාදය, වැනි නව ආකාරයක පංති සමාජයක් මගින් විතැන්කර තිබුණෝය යන්න ප්‍රකාශ කිරීම මගිනි. මෙම විශ්ලේෂණයන් දෙකෙහිම වැඩපිළිවෙලමය නිගමනය වුයේ අධිරාජ්‍යවාදය සමඟ ඕනෑම ගැටුමක් තුළ ,ස්ටැන්ලිවාදීන්ගේ රාජ්‍යයන්, ආරක්ෂා කිරීම ප්‍රතික්ෂප කිරීමය.

1951 හතරවන ජාත්‍යන්තරයේ තුන්වන සම්මේලනය යුගෝස්ලේවියාව පිළිබඳව ගෙන ආ පැබ්ලෝගේ න්‍යායට විරුද්ධ නොවූ අතර මාධ්‍යමිකවාදයට ඇද වැටුණෝය. ජාත්‍යන්තර ලේකම් මණ්ඩලය (IS) ද ජාත්‍යණ්තර කමිටුව (IC) වශයෙන් තමන්ව හඳුන්වාගත් එක්සත් ජනපදයේ සමාජවාදී කම්කරු පක්ෂය (SWP) හා එහි ආධාරකරුවන් ද අතර 1953 දී ඇති වූ බෙදීම 1951 වැඩපිළිවෙල සම්බන්ධ සංශෝධන පිළිබඳ නොඑකඟතාවන්ගේ ප්‍රතිඵලයක් නොවූ අතර එය වැඩිමනත්ම ඇති වුයේ ස්ටැන්ලිවාදී පක්ෂ තුළට ප්‍රවේශ වීමේ ,සුවිශේෂී ප්‍රවේශවාදී ආකෘතියක්, (Entrism Suigeneris) පිළිබඳ යෝජිත උපක්‍රමය පාදක කර ගෙනය. ජාත්‍යන්තරයේ ඉහළම මණ්ඩලයට ප්‍රශ්න ඉදිරිපත් කළ හැකිව තිබුණු සැලසුම් කර තිබූ 1954 සම්මේලනයට කලින් එය කරනු ලැබූ හෙයින් බෙදීම ප්‍රතිපත්ති සහගත නොවී ය. එකදු කණ්ඩායමක්වත්

ජාත්‍යන්තර කමිටුව ජාත්‍යන්තර ලේකම් මණ්ඩලයේ වැරදි පිළිබඳ පාර්ශවීය නමුත් නිවරදි විවේචන ගණනාවක් ඉදිරිපත් කළේ ය. කෙසේ නමුදු 1951 සම්මේලනයේ වැරදි තීරණ තුළ මුල් බැස තිබුණ යළි යළිත් සිදු වූ අවස්ථාවාදී පීලිපැනීම් සම්බන්ධයන් දෙපාර්ශවයම වැරදිකරුවන් වේ.

1951 පිළිගන්නා ලද ක්‍රමවේදයේ පදනම මත ජාත්‍යන්තර ලේකම් මණ්ඩලය හා සමාජවාදී කම්කරු පක්ෂය/එක්සත් ජනපද යන දෙකම කැස්ත්‍රෝ නායකත්වය "නිර්ධන පංති බලයේ ආකෘති" එනම් කම්කරු සභා සංවර්ධනය කිරීමට අසමත් වුයේ වුව ද ඇත්ත වශයෙන්ම නොනවතින විප්ලවයේ මුලෝපාය ක්‍රියාත්මක කිරීමට බල කෙරී තිබුණ ,ඓතිහාසික ක්‍රියාවලියේ, තවත් කාරකවරයෙක් ලෙස සලකමින් 1959 කියුබන් විප්ලවය අවස්ථාවාදී ආකාරයකින් සැලකිල්ලට ගත්තේය. මෙය හතරවන ජාත්‍යන්තරයේ එක්සත් ලේකම්

> **..ඉතිහාසයේ නීල්ගේ දේශපාලන භාවිතය පිළිබඳ නැවත ආවර්ජනය කරනවානම් ඔහුට සිහිපත් කළ යුත්තේ 1980 දශකයේ න.ස.ස.ප තුළ ඇති වු සුළුතර බහුතර සංවාදයේ දී වික්‍රමබාහුගේ මනෝරාජික දේශපාලන ඉදිරි දර්ශන ආරක්ෂා කිරීමේ අග්‍ර පුරෝහිතයා බවට ඔහු පත්වී තිබුනු බවත් මාක්ස්වාදී මූලධර්මවලින් බැහැරව සිටි බව ය. නීල් සමඟ සිටී න.ස.ස.ප. නායකයින් බොහෝ දෙනා මේ වනවිට ධනපති කඳවුරු වල බැල මෙහෙවරකම් කරන්නන් බවට පත්වී තිබීම එයට හොඳම උදාහරණය වේ. නීල් විසින්ම ඉතිහාසය සිහිකිරීම නිසා අවසන් වශයෙන් මෙය සඳහන් කිරීමට සිදු වූ බව දන්වා සිටිමු. අප විසින් ගොඩ නැගීමට තීරණය කරනු ලැබූ පක්ෂය නීල්ගේ අධිපතිවාදී ක්‍රියාකලාපය නිසා බිඳවැටී දැමීමට ක්‍රියා කර තිබේ. මෙහි දේශපාලන ඇගයීම ඔහු විසින් ම ඉදිරපත් කර තිබෙන 4 වන ජාත්‍යන්තරයේ මත පදනම් වී කටයුතු කළ යුතු යැයි යෝජනාව අපි නැවත තරයේ ප්‍රතික්ෂේප කරන බව දන්වා සිටිමු.**

මණ්ඩලය ගොඩ නැගීමට මග පැදු 1963 එක්සත් කිරීමේ සම්මේලනය සඳහා වු පදනම ස්ථාපිත කළේය. එසේම මෙය මොරීනෝ විසින් නායකත්වය දෙන ලද ජාත්‍යන්තර කමිටුවේ ප්‍රධාන ලතින්

ට්‍රොට්ස්කිගේ ජාත්‍යන්තරය සමඟ අඛණ්ඩතාව නියෝජනය කළේ නැත. සත්තකින්ම දෙපාර්ශවයම 1951 සම්මේලනයේ තීරණ පිළිගත් හෙයින් ඔවුන් අතර මුලික වැඩපිළිවෙලමය හෝ ප්‍රතිපත්තිමය වෙනසක් තිබුණේ නැත. ජාත්‍යන්තර ලේකම් මණ්ඩලය සංවිධානමය සංගතියක් හා අඛණ්ඩතාවක් පවත්වා ගත් අතර

ඇමෙරිකානු පාර්ශවය ඇද ගත්තේ ය. ලැම්බර්ට් හා හීලි විසින් නායකත්වය දෙන ලද ප්‍රධාන යුරෝපීය පාර්ශව පිටත රැඳී සිටි නමුදු පෙර පැවතියාට වඩා සංවිධානමය වශයෙන් එක්සත් වුයේ ය. අනතුරුව හතරවන ජාත්‍යන්තරයේ එක්සත් ලේකම් මණ්ඩලය (USFI) ගරිල්ලාවාදය කරා හැරවුමක් ගත් විට එයට මොරිනෝ හා සමාජවාදී කම්කරු

පක්ෂය/එක්සත් ජනපද යන දෙකම විරුද්ධ විය. තව ද නිකරගුවාවේ සැන්ඩිනිස්ටා ආණ්ඩුව හතරවන ජාත්‍යන්තරයේ එක්සත් ලේකම් මණ්ඩලයේ (USFI) බහුතරයකගේ පිළිගැනීම සම්බන්ධයෙන් ඇති වු නොඑකඟතා බෙදීමක් ඇති කළේය. ලැම්බර්ට් හා හීලි විසින් නායකත්වය දෙන ලද ධාරාවන්ගේ දිගටම පැවති අපසරණයත් සමඟ එවැනි වර්ධනයන් ජාත්‍යන්තර ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ ඇතිව තිබුණු බිඳී විසිරියාම ස්ථිර කළේය.

හතරවන ජාත්‍යන්තරයේ බෙදීමෙන් අවුරුදු හැට හයකට පසු අද විප්ලවවාදීන්ට ද 1917 දී විප්ලවීය කොමින්ටර්නය එහි මුල් සම්මේලන හතරේ දී ලෙනින්ට කරන්නට සිදුව තිබුණා සේ ම හා 1938 ට්‍රොට්ස්කි කළා සේ ම විප්ලවීය වැඩපිළිවෙල නැවත විස්තර කරමින් නව ජාත්‍යන්තරයක් සඳහා ගැඹුරු කතිකාවකට මුල පිරිය යුතුවේ.

## නීල්ගේ තක්කඩි භාෂාව සාමුහික නායකත්වය බිඳ දැමීමක් විණ.

මෙලෙස කරුණු ඉදිරිපත් කිරීමෙන් පසු නීල් සහෝදරයා පිළිතුරු කතාව ආරම්භ කරමින් 4 වන ජාත්‍යන්තරයේ ඉතිහාසය පිළිබඳ නැවත කියවීමක් ආරම්භ කිරීමට මුල පුරන ලදී. එයට බාධාකරමින් මම කියා සිටයේ ඔහුගේ ඉදිරිපත් කිරීමෙන් පසු නැවත අවස්ථාවක් මට ලබා දෙන ලෙසය. එයට අවේගවාදී ලෙස ප්‍රතිචාර දක්වමින් නීල් කියා සිටියේ පසුගිය දේශපාලන මණ්ඩලයේදී තක්කඩිකමක් කරන බවත් අදත් එවැනි තක්කඩිකමක් කරන බවත්ය. මෙමගින් භාෂාව සහෝදරත්වය බිද දැමීමට ක්‍රියා කළේ ය. ඔහු මෙලෙස ආවේග වුයේ 4 වන ජාත්‍යන්තරය ආරම්භ කිරීමට ඔහු ගත් උත්සාහයට මම විරුද්ධ වීම නිසා ය. ඔහුගේ මෙම ප්‍රතිචාරය මගින් පෙනී ගියේ ඔහුගේ ආධිපත්‍ය ඉදිරියට ගැනීමක් ලෙස ය. මෙවන් චරිතවල හැසිරීම් ඉතිහාසය පුරා සංවිධානවල ඉදිරි පැවැත්මට තිරිංගයක් වූ බව මෙහිදී සඳහන් කළ යුතුව තිබේ.

ඊට පසු 2021.11.14 දින රැස්වු මධ්‍යම කාරක සභාවේ දී නීල් සහෝදරයා නැවත ජාත්‍යන්තර ඉදිරි දර්ශනය ඉදිරිපත් කරමින් කියා සිටියේ 4 වන ජාත්‍යන්තරයේ පිරිහීම් තිබෙන බවත් නව විප්ලවකාරී ජාත්‍යන්තරයක් අවශ්‍ය බවත්ය. ඔහු මෙදින කළ ඉදිරිපත් කිරීම මඟින් මට හැගී ගියේ මම කරනු ලැබූ අවධාරනය හා ඔහු කරන අවධාරනය අතර සමානකම් තිබෙන බව ය. ඔහුගේ අදහස් ඉදිරිපත් කිරීමෙන් පසු මම කරුණු දක්වමින් පෙන්වා දුන්නේ 4 වන ජාත්‍යන්තරයේ පිරිහීම් පිළිගැනීමට නීල් සහෝදරයා ඉදිරිපත් කරනු ලැබූ අදහස් නිවැරදි බවත්ය. ඒ අනුව ඉහත සඳහන් 4 වන ජාත්‍යන්තරයේ පිරිහීම් ගැන මම නැවත අවධාරනය කරන ලදී, කුමාර් සහෝදරයාද 4 වන ජාත්‍යන්තරයේ ඉතිහාසය ගැන යම් කරුණු දැක්වීමක් ඉදිරිපත් කරන ලද ලද අතර නව ජාත්‍යනතරයක් වෙනුවෙන් පෙනී සිටීම ප්‍රතික්ෂේප කළේ නොමැත. නව ජාත්‍යන්තරයක් පිලිබඳ අදහස බොළඳ අදහස් බවට ලංකාපේලි සහෝදරයාගේ පමණක් අදහස් ඉදිරිපත් කරමින් පෙන්වා දිමට උත්සාහ කළේය.

මෙහිදී අවසන් පිළිතුරු කතාව කරමින් නීල් සහෝදරයා පළමු ඉදිරිපත් කිරිමට හාත්පසින් ම වෙනස් ලෙස 4 වන ජාත්‍යන්තරයේ ඉතිහාසය ආරක්ෂා කරමින් නව ජාත්‍යන්තරයක් යන අදහස ක්‍රියාවට නැගිය නොහැකි බවට කරුණු ඉදිරිපත් කළේය. ඔහු තවදුරටත් අදහස් දක්වමින් අපගේ ඉතිහාසය තුළ C.W.I ජාත්‍යන්තරයෙන් ඉවත් කළ බවත් 5 වන ජාත්‍යන්තරයෙන් ඉවත් කළ බවත් පෙන්වා දෙමින් ආවේගවාදී ලෙස අපගේ දේශපාලන භාවිතයට පහර දෙන්නට කටයුතු කළේ ය.


ඔහු ඉහත සාකච්ඡාවල දී ඉතිහාසය ගැන කරුණු ඉදිරිපත් කිරීම පලක් නොමැති බව නීල් කියා සිටියත් ඔහු විසින්ම දෙවන සාකච්ඡා වටයේ එය බිඳ දමනු ලැබූ බව පෙනී ගියේය.

ඉතිහාසයේ නීල්ගේ දේශපාලන භාවිතය පිළිබඳ නැවත ආවර්ජනය කරනවානම් ඔහුට සිහිපත් කළ යුත්තේ 1980 දශකයේ න.ස.ස.ප තුළ ඇති වු සුළුතර බහුතර සංවාදයේ දී වික්‍රමබාහුගේ මනෝරාජික දේශපාලන ඉදිරි දර්ශන ආරක්ෂා කිරීමේ අග්‍ර පුරෝහිතයා බවට ඔහු පත්වී තිබුනු බවත් මාක්ස්වාදී මූලධර්මවලින් බැහැරව සිටි බව ය. නීල් සමඟ සිටී න.ස.ස.ප. නායකයින් බොහෝ දෙනා මේ වනවිට ධනපති කඳවුරු වල බැල මෙහෙවරකම් කරන්නන් බවට පත්වී තිබීම එයට හොඳම උදාහරණය වේ. නීල් විසින්ම ඉතිහාසය සිහිකිරීම නිසා අවසන් වශයෙන් මෙය සඳහන් කිරීමට සිදු වූ බව දන්වා සිටිමු. අප විසින් ගොඩ නැගීමට තීරණය කරනු ලැබූ පක්ෂය නීල්ගේ අධිපතිවාදී ක්‍රියාකලාපය නිසා බිඳවැටී දැමීමට ක්‍රියා කර තිබේ. මෙහි දේශපාලන ඇගයීම ඔහු විසින් ම ඉදිරපත් කර තිබෙන 4 වන ජාත්‍යන්තරයේ මත පදනම් වී කටයුතු කළ යුතු යැයි යෝජනාව අපි නැවත තරයේ ප්‍රතික්ෂේප කරන බව දන්වා සිටිමු. ▪

මෙයට-සහෝදරත්වයෙන්

**මහින්ද දේවගේ**
**ඊ.ඒ.පි. අල්විස්**
**විල්ප්‍රඩ් සිල්වා**
**ජේමචන්ද්‍ර විතානවසම්**
**ප්‍රේමලාල් ජයවික්‍රම**

(දේශපාලන මණ්ඩල සභිකයින් සමාජවාදී ජනතා පක්ෂය)



# ජවිපෙ පාර්ලිමේන්තු භූමිකාව

ප්‍රේමචන්ද්‍ර විතාණවසම්

පාර්ලිමේන්තුව නියෝජනය කරන ජවිපෙ නායකයින්ගේ වත්මන් භූමිකාව ලෙස පෙනෙනුයේ ආණ්ඩුවේ දූෂණ වංචා හෙළි කිරීම මගින් සමාජයේ යම් ජනතා පිරිසකගේ අතර අනුකූලත්වයක් ලබා ගැනීම බව පෙනේ. මෙම ජවිපෙ භූමිකාව 2015 පසුව ද දක්නට ලැබුණි. එම මැදිහත් වීම නිසා ඔවුන් විපක්ෂයේ ප්‍රධාන භූමිකාව කරන බවටද සමහර මධ්‍යම පංතික සමාජ බලවේග අතර සාකච්ඡාවට ලක්වීමේ ප්‍රවණතාවයක් දකින්නට ලැබුණි. එවන් ජන කොටස් වල අනුකූලත්වය ලබා ගැනීමට හැකි වුවත් ජනාධිපතිවරණයේ දී හා පාර්ලිමේන්තු මැතිවරණයේදී ඔවුන්ට ලැබුණු ඡන්ද වලින් එය දකින්නට නොලැබුණි. මෙමගින් පෙනී ගියේ ජවිපෙ ඡන්ද පදනම 1983 දී එහි නායක විජේවීර ගත් ප්‍රමාණයටත් වඩා අඩු වී ඇති බවය. ඔවුන් 2000 ගණන්වල සිට පැවැති මැතිවරණ වලදී ධනපති පංති පක්ෂ බලයට පත් කිරීමට දායකවීම නිසා ජ. වි. පෙ. සාම්ප්‍රදායික පක්ෂයක් බවට පත් විමය. වර්තමානය වන විට ජවිපෙ සමාජ ප්‍රජාත්ත්‍රවාදී පක්ෂය ස්වරූපය ගනිමින් තිබේ. ඔවුන්ට මධ්‍යම පංති බලවේග අතර යම් සමාජ අනුකූලතාවයක් තිබේ. නාගරික ජනතාව අතර බලපෑමක් කිරිමට හැකිවී ඇත. මෑතකදී අනුර කුමාර දිසානායක රූපවාහිනි වැඩසටහනකදී ප්‍රකාශ කලේ ඔවුන්ගේ අරමුණ පවත්නා දේශපාලන සංස්කෘතිය වෙනස් කිරිම මුලික අපේක්ෂාව බවය. පවත්නා අර්බුදයට ඇති විසඳුම ද එය බව ඔහු කියා සිටියේය. ඔහු අනුගමනය කරන ආර්ථික මොඩලය කුමක්ද යන්න පැහැදිලි කලේ නැත. මේ අතර රටේ සම්පත් සමසේ බෙදීයන ක්‍රමවේදයක් අනුගමනය කරන බව පවසා සිටින ලදී. එහිදී අපනයන ආර්ථිකයක් ගොඩනැගීම තමන්ගේ අරමුණ බව ද ප්‍රකාශ කළේය. එවන් තත්වයක් තුළ පාලකයන්ට මෙන්ම ජනතාවට කැපකිරීම් සිදුකිරීමට සිදුවන බව ඉගි කළේය. දැනට ගෙවා ගැනිමට නොහැකි මට්ටමේ ඇති විදේශ ණය වාරික ගෙවීම අරභයා ඒ ඒ රටවලින් සහනයක් ඉල්ලා සිටීමටත් ඩොලර් අර්බුදය විසඳීමට විදේශ ශ්‍රමිකයන්ගෙන් කිසියම් ඉල්ලීමක් කොට ඔවුන් දැනටමත් එවන මුදල් වලට අමතරව වැඩිපුර ඩොලර් 500ක් හෝ එවන ලෙස ආයාචනා කිරීමට කටයුතු කරන බවත් කියා සිටියේය.

අනුර කුමාරගේ මේ ආර්ථික දැක්ම 70 දශකයේ සමගි පෙරමුණ ආණ්ඩුව ක්‍රියාවට නැගුවක් බව මෙයින් පැහැදිලි වේ. මේ ආර්ථික සැලැස්ම මඟින් ජවිපෙ දේශපාලන දැක්ම හොඳින් පැහැදිලි වේ. මෙවැනි ආර්ථික වැඩපිළිවෙලක් වර්තමානයේ කුමන රටකවත් ක්‍රියාවට නගන්නේ නැත. එය ධනපති ක්‍රමය ප්‍රතිසංස්කරණය කිරීමේ මාවතක් බව දකින්නට ලැබේ. මෙමගින් නැවත ඔප්පු වි තිබෙන්නේ ජවිපෙ ප්‍රතිසංස්කරණවාදි දේශපාලනයට යොමු වෙමින් නව ධනපති පක්ෂයක් ගොඩ නැගමේ දිසාවට ගමන් කරමින් තිබෙන බව ය.■

# විදේශ සංචිත හිඟයෙන් බේරීමට නොහැකි පාලකයින් බඹගාලක පැටලී සිටියි..



රටනියා නිදහසින් පසු ගෙවී ගිය වසර 73ක කාල පරාසය තුළ බලයට පත් වූ සියළු පාලකයින් අනුගමනය කරනු ලැබූ ප්‍රතිපත්තිය වූයේ ආදායමට වඩා වියදම් වැඩි අයවැය වියදම් පියවා ගැනීම සඳහා දේශීය සහ විදේශීය රටවලින් ණය දිගින් දිගටම ගැනීමයි. රටේ ආදායම ප්‍රධාන වශයෙන් සමන්විත වී තිබෙන්නේ බදු ආදායමෙන් වේ. ආණ්ඩුවේ බදු ආදායම අඩු කළ විට රජයේ ආදායම අඩු වේ. එත් ව්‍යාපාරකයින්ට බදු අඩුවෙන් ගෙවීමට සිදු වන විට ඔවුන් වැඩිපුර ආයෝජනය කර නිෂ්පාදනය වැඩිකර ආර්ථිකය නංවනු ඇතැයි පාලකයින් බලාපොරොත්තු වේ. මේ මඟින් රටේ දළ දෙශීය නිෂ්පාදනය ඉහළ යනු ඇත. ආණ්ඩුව සීමාවකින් තොරව කරන වියදම් නිසා අයෝජන වලින් ලැබෙන ප්‍රතිලාභ වලින් රටේ දළ දේශීය නිෂ්පාදනය හේතුවෙන් ගෙවීමට තිබෙන ණය ප්‍රමාණය සාපේක්ෂ වශයෙන් අඩුවීම වැළැක්වීමට නොහැකිවේ. මේ අදුරදර්ශී ක්‍රියාකලාපය කිසිසේත් විසඳන්නට නොමැකි වේ. පසුගිය කාලය පුරාම රාජපක්ෂ පාලනය මෙලෙස අතිවිශාල වංචා දුෂණ උග්‍ර වෙමින් තිබෙන අතර, අවශ්‍ය ලෙස ප්‍රචාරන කටයුතු සඳහා තම පැවැත්ම ආරක්ෂා කරගැනීමට මහජන සම්පත් තම උවමනාවට වඩා පරිහරණය කිරීමට ක්‍රියා කළේය.

මේ අතරවිදේශ රටවලට යවන භාණ්ඩවලින් ලැබෙන ආදායම රටට ගෙන්වන භාණ්ඩවලට කරන වියදම අධික වී තිබේ.වෙළඳ ශේෂය හිඟ වීම දීර්ඝ කාලීනව පැවැති දෙයකි. මේ හිඟය පියවීමට විදේශ ණය ගෙවීමට සිදුවේ. වසංගත හේතුව නිසා සංචාරක කර්මාන්තය බිඳ වැටීමට ද විදේශ ශේෂය ඇතුළු ජංගම ගිණුමේ හිඟය වැඩි වීමට හේතු විය. මේ අර්බුදයෙන් ගැලවීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ගත යුතු බවට පාලකයින්ට බලපෑම් එල්ල වෙමින් තිබේ. පාලකයින් මේ තීන්දුව ගැනීමට ප්‍රමාද කරමින් සිටින්නේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ණය ගැනීමට සිදුවුවහොත් ඒ මඟින් ඇතිවන කොන්දේසි ඉටුකිරීමට සිදුවීමද විශේෂයෙන්ම රාජ්‍ය අංශය, රාජ්‍ය ආයතනවල අනවශ්‍ය වියදම් කපා හැරීම රාජ්‍ය ආයතන ඒවායේ ආයෝජකයන්ට සාපේක්ෂව ලාභ ලබන තත්වයකට පත් කිරීම මඟින් අයවැය හිඟය අඩු කිරීමයි.

විදේශ වලින් ආනයන කර ඇති භාණ්ඩ විශාල ප්‍රමාණයක් කන්ටේනර් වල හිරවී ඇති බව වාර්තා වෙමින් තිබේ. මෙයට හේතුව රටේ මතුවී තිබෙන ඩොලර් හිඟය බව බලධාරීන්ම පවසා ඇත. රුපියල් වලට හිලව්වට ඩොලර් නිකුත් කිරීම මහ බැංකුව අසමත්වීම නිසා වරායේ තිබෙන භාණ්ඩ මෙලෙස හිරවී තිබීමට හේතුව වී තිබේ. මේ නිසාම ආනයනික භාණ්ඩ හිඟයක් මතු වීම වැළැක්වීමට නොහැකිය. ආණ්ඩුව විසින් විවිධ භාණ්ඩවලට මිල පාලනයක් පැනවීම ද මෙයට හේතුව විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස විදේශ විනිමය අනුපාතයට මිල පාලනයක් පනවා ඇත. එමෙන්ම බැංකු වලින් නිකුත් කරන ණයවර ලිපි පිටරට බැංකු විසින් පිළි නොගන්නා තත්වයකට පත්වි තිබේ.

ආණ්ඩුව මෙයට මුහුණදීම සඳහා එක ගලෙන් කුරුල්ලන් කීපදෙනෙකු දඩයම් කිරීමේ ක්‍රියාවලියකට අර අදිමින් තිබේ. පොහොර ආනයනය සඳහා ගෙවන්නට සිදුවන ඩොලර් ඉතිරි කරගැනීම සඳහා පොහොර සහනාධාරය සඳහා ගෙවන්නට වන රුපියල් ඉතිරි කරගැනීම සඳහා රසායනික පොහොර ආනයනය නවතා දැමීමට සිදු වුයේ ද ඒ නිසාය. කාබනික පොහොර යොදා නිෂ්පාදනය කරන බෝග සඳහා ලෝක වෙළෙඳ පොලේ ඉහළ ඉල්ලුමක් සහ මිලක් තිබේ. මුළු රටම කාබනීකරණය කළ විට මේ ඉහළ මිල අපගේ කෘෂි අපනයනවලට ලබාගැනීමට හැකි යයි ආණ්ඩුවට උපදෙස් දෙන වියත්මග නියෝජනය කරන බක පණ්ඩිතයන් සිතන බව පෙනේ.මේ නිසාම රටේ සහල් ඇතුළු ආහාර හිඟයක් ඇතිවීම වැළැක්වීමට නොහැකිය.

වර්තමාන ආර්ථික අර්බුදය කොවිඩ් වසංගතය නිසා ඇති වුවක් නොවේ. පසුගිය යුගය තුළ සිටි පාලකයින් අයවැය හිඟයටද වෙළෙඳ ශේෂ හිඟයට වියදම් ඉදිරිපත් කිරීමට නොහැකි වීම මෙයට ප්‍රධාන හේතුවක් වී තිබේ. කොවිඩ් වසංගතය නිසා සිදුවුයේ කාලයක් තුළ ඇති වෙමින් තිබු අර්බුදය තීව්‍ර වීමය. මෙය වර්තමාන පාලකයින්ගේ අමනෝඥ ක්‍රියා කලාපය නිසා රට ගොඩ ගැනීමට නොහැකි දැවැන්ත අර්බුදයට ඇද දමා තිබේ.

මෙම කොන්දේසි දීර්ඝ කාලීනව රටට හිතකර නමුත් ධනපති පාලකයින්ට ඊළඟ මැතිවරණය ජයගුහණය සඳහා තමන්ගේ අන්තේවාසිකයින් රජයේ ආයතනවල විවිධ තනතුරු වලට පත්කිරීම සඳහා ද ඒවා අහිතකර වේ.

චීනය ණය හෝ වෙනත් ආණ්ඩුවලින් ලබා ගන්නා ණය සඳහා මේ කොන්දේසි පැනවෙන්නේ නැත. එම ලැබෙන මුදල් පාලකයින් අවශ්‍ය පරිදි තම හෙන්චයින්ට ගසා කෑමට නිසි පරිදි ඉඩකඩ ලබා දී තිබේ.

වසංගතයට මුවාවී අර්බුදය වසාගන්නට උත්සහ කරන පාලකයින්ගේ ප්‍රෝඩාකාරී කතාවලට මුලා නොවී සිටි ලෙස ජනතාවගෙන් අපි ඉල්ලා සිටිමු.■

ආර්.ඇම්.පී. අල්විස්

# මුදල් අච්චු ගැසීම නිසා ඉහළ යන උද්ධමනය..

ලාංකේය සමාජයේ මුහුණ දෙන දැවැන්තම අර්බුදයට අපි මේ වන විට මුහුණ දෙමින් සිටිති. මේ අර්බුදය තීව්‍ර වීමට රාජපක්ෂ පාලනය බලයට පත්වූ දා සිට අලුතින් මුදල් අච්චු ගසා ඇති ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 2 ක් දක්වා වැඩි වීම ප්‍රධාන වී තිබේ. (රුපියල් කෝටියේ ඒවා ලක්ෂයක්) එය රටේ සමස්ත මුදල් සම්භාරයෙන් සියයට 30 - 35 ප්‍රමාණයකි. වසර 73කට පසු කිසිදු රජයක් මෙතරම් මුදල් ප්‍රමාණයක් අවුරුදු දෙකක් වැනි කෙටි කාලයක් තුළ අච්චු ගසා නොමැති වීම මෙයට හේතුව වේ.

පසුගිය දෙවසර තුළ කොවිඩ් වසංගතය හේතු කොට ගෙන නිෂ්පාදන කටයුතු පවත්වාගෙන යාමට නොහැකි වී තිබූ නිසා සියට 40කට ආසන්න මුදල් ප්‍රමාණයක් ආර්ථිකයට පොම්ප කිරීමට සිදුවූ නිසා අර්බුදය තවදුරත් තීව්‍ර වී තිබේ. මේ නිසාම නිෂ්පාදන මිල ගණන් ඉහළ යමින් තිබෙන අතර එය ජනතාවට දරා ගැනීමට නොහැකි තත්වයකට පත්වී තිබේ.

දිගින් දිගටම මුහුණු දෙන අර්බුදයෙන් ගොඩ ඒමට පාලකයින්ගේ විසඳුම් නොමැති වීම නිසා මේ වනවිට විදේශ ණය පමණක් ඩොලර් බිලියන 3.7 ගෙවීමට සිදු වී ඇති අතර දැනට ගෙවා ඇත්තේ බිලියන 1.3 ක් පමණි. එහි ඉතිරි ණය ප්‍රමාණය බිලියන 2.4ක් වනු ඇත. පාලකයින්ට ණය කළමණාකරණය කරගැනීමට නොහැකි වී ඇති නිසා ණය ගෙවීමට ආදායම් මාර්ග නොමැති වී තිබේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් ලබාගැනීමට බලාපොරොත්තු වූ මුදල් වලින් සියයට 50ක්වත් තවම ලැබී නොමැති අතර විදේශ සංචිතය පියවා ගැනීමේ උභතෝකෝටියකට පාලකයින් මුහුණ දෙමින් තිබෙන බව පෙනේ. මේ වනවිට විදේශ සංචිතය 3.5ක් පමණ වී ඇති නිසා එය සෘණ අගයක් ගෙන තිබෙන අතර එය ඩොලර් බිලියන 1.7 දක්වා පහත වැටී තිබේ. මේ අනුව විදේශ සංචිතය මාස දෙකකටවත් ප්‍රමාණවත් වී නොමැත. එමෙන්ම දල දේශීය නිෂ්පාදනයෙන් සියයට 1.15 පමණ වී තිබේ. මේ අර්බුදයේ ප්‍රතිඵලයක් ලෙස ඉහළ යන භාණ්ඩ මිල හමුවේ ජන ජීවිතය පවත්වා ගෙන යන්නට නොහැකි තත්ත්වයක් උදාවී ඇත.

මෙවන් අර්බුදයක් තුල ලබන අයවැය සඳහා ඉදිරිපත්කර තිබෙන විසර්ජන පනත මඟින් වඩා වැඩි මුදලක් වෙන්කර ඇත්තේ ආරක්ෂක වියදම් සඳහා වන අතර සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා වෙන්කර ඇති මුදල 2020ටත් වඩා අඩු වී ඇත. සාමාන්‍යයෙන් අයවැය පරතරය දළ දේශිය නිෂ්පාදිතයෙන් 5% - 7%ක අගයක් ගන්නා අතර පසුගිය වසරේ අයවැය පරතරය 14%කටත් වඩා වැඩි වී ඇති බව දක්නට ලැබුණි. මේ අතර අපනයන ආනයන පරතරය දිගින් දිගටම වැඩි වෙමින් තිබේ. මේ අර්බුදයට පැලැස්තර විසදුම් ලබාදීමට නොහැකි වේ. එයට හේතු වනුයේ අර්බුදය පිළිකාවක් තරමටම ඔඩුදුවා ඇති නිසාය. ආසන්න වශයන් කෙටි කාලීන විසඳුම් වලින් පාලකයින්ට බේරීමට පුලුවන් කමක් නොමැත.

පාලකයින්ට මේ අර්බුදයෙන් ගොඩ ඒමට නොහැකි නිසා රාජ්‍ය සම්පත් ඇමරිකාව, චීනය සහ ඉන්දියාවට විකුණා දැමීමට තීන්දු කරමින් තිබේ. වරායේ බටහිර ජැටිය සියයට 41%ක් ඉන්දියාවේ අදානි සමාගමට දීමට තීන්දුකර ඇති අතර, මේ පසුබිම තුළ යුගදනවි බලාගාරයේ කොටස් වලින් සියයට 40ක් විකිණීමට තීන්දු කර තිබේ. ඒ සඳහා එකී සමාගම ඇමරිකානු ඩොලර් මිලියන 250 ආණ්ඩුවට ගෙවීමට තීරණයකර තිබේ. ආණ්ඩුව මෙම ගිවිසුම මඟින් වසර පහක් දක්වා ලංකාවට ගෑස් සැපයමට නිව් ෆොට්‍රෙස් එනර්ජි සමාගමට අවස්ථාව ලබාදී ඇත. මේ මඟින් රටේ විදුලිබල ඉල්ලුමෙන් 1/3ක් සැපයීමට එම සමාගමට බලය පවරා තිබේ.

## කෘෂිකර්මාන්තයේ බිඳවැටීම

කෘෂිකර්මාන්තය ජීවනෝපාය කරගත් සියයට 30කට ආසන්න පිරිසක් සිටි නමුත් මේ වන විට එම සංඛ්‍යාව 12% දක්වා පහත වැටී තිබේ. එහි මතු වී තිබෙන බිඳ වැටීම අන් කවරදාකටවත් වඩා උග්‍ර වී ඇත. පොහොර ගෙන්වීමට විදේශ විනිමය නොමැති නිසා හදිසියේ රසායනික පොහොර වෙනුවට කාබනික පොහොර භාවිතයට ගන්නා ලෙස ජනාධිපතිවරයා තීරණය කරනු ලැබිය. ගෙවියන් බහුතරය ඉල්ලන්නේ රසායනික පොහොර ලබා දෙන ලෙසය. ගොවි ජනතාවට බලහත්කාරයෙන් නියෝග පැනවීමට තීරණය කිරීම හමුදා මානසිකත්වයක් ඇති ගෝඨාභයගේ ආවේණික ලක්ෂණයක් වී තිබේ.

රසායනික පොහොර, කෘෂි හා කෘමි නාශක වර්ග වස විෂ යනුවෙන් හඳුන්වන දැවැන්ත ව්‍යාපාර තිබේ. මෙය ලංකාවට පමණක් සීමා වූවක් නොවේ. ලෝකයේ බොහෝ රටවල මෙය දකින්නට ලැබේ. පොහොර හා රසායනික රහිත ගොවිතැන කළ හැකි බව ද ගෙවීන් නොදන්නවා නොවේ. මෙයින් හොඳ අස්වැන්නක් නොලැබෙන බවද ඔවුන් දනී. වැඩි නිෂ්පාදනයක් නොමැති අවස්ථාවල රසායනික භාවය සම්පූර්ණයෙන්ම නැති කෘෂිකර්මයක් නොගැපෙන බවට විවාදයක් පවතී. සීමිත ඉඩම් ප්‍රමාණයකට හිමිකම් කියන බොහෝ ගොවියන්ගේ එදිනෙදා ජීවන තත්ත්වය පවත්වා ගෙන යන්නට නොහැකි විම පොහොර අර්බුදය නිසා උග්‍ර වි තිබේ. අඩු ශ්‍රමයකින් වැඩිවන ජනගහනයට අවශ්‍ය ආහාර නිපදවීමට පාලකයින්ට කිසිදු සැලැස්මක් ඉතිහාසය පුරාම දකින්නට නොමැති විය. වස විසෙන් තොර කෘෂිකර්මාන්තයක් අත්‍යවශ්‍ය බවට විවාදයක් නොමැත.

ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රාන්තයේ කාබනික ආහාර නිපද වීමට උත්සහයක් තිබුණි. මේ වන විට බොහෝ ගොවියන් කාබනික ගොවිතැන අතහැර දමා තිබේ. එයට දැරීමට සිදුවන වියදම ඔවුනට ඉසිලිය නොහැකි වීම එයට හේතුව වී තිබේ. නිලධාරීන්ගේ බලපෑම හා බලපත්‍ර ගැනීමට සිදු වීම නිසා මුදල් වැයවීම ඔවුනට විඳදරා ගැනීමට නොහැකි වීම මෙයට හේතු වී ඇත. පොහොර ගෙන්වීමට විදේශ විනිමය නොමැති නිසා වසවිෂ නැති ගොවිතැනක සාකච්ඡාවකට කිරීමට මුල පිරීමේ වැදි බණවලින් එලක් නැත. පොහොර නොමිලේ ලබාදෙන බවට පොරොන්දු වී බලයට පැමිණි පාලකයින්ට මුදලටවත් පොහොර ලබාදීමට නොහැකි වී ඇත.

## සාගතයකට පාර කැපීම


ධනපති පංතියේ වියයුතුන් පවා මේ වනවිට කියා සිටින්නේ සාගතයක් ඇතිවීමේ බියකරු අනතුරක් පහළ වෙමින් තිබෙන බවය.ලෝක බැංකුව රටවල් 48 ඇසුරින් කර තිබෙන පර්යේෂණයක් මගින් පවසා තිබෙන්නේ එම රටවල ජනතාව දරුණු ආහාර අර්බුදයකට මුහුණ දෙන බවය.2013 සිට 2021 වනවිට මෙම එම රටවල ආහාර මිල සියයට 30 කින් පමණ ඉහළ ගොස් ඇති බවද වාර්තා වේ. ආසියානු රටවල මිලියන 20000 ක් පමණ ආහාර දරිද්‍රතාවයට මුහුණදෙමින් සිටින බවද එහි දක්වා තිබේ.මේ ආහාර හිඟයට මුහුණදීමට පොහොර වෙනුවට හාල් ආනයනය කිරීම වාසිදායක ක්‍රමයක් බව පාලකයින් අදහස් ඉදිරිපත් කිරීමට පටන් ගෙන තිබේ.

පොහොර හා රසායනික බෙහෙත් ගෙන්වන්නට පසුගිය වසරේ වැය වූ මුදල රුපියල් බිලියන 56 ක් බව ජාතික පොහොර ලේකම් කාර්යාලය වාර්තා කර තිබුණි.මේ පොහොර සහනාධාරයක් වශයෙන් ලබාදෙන නිසා ආණ්ඩුවට ආදායමක් නැත.වස විස නැති කෘෂිකර්මය වහාම ක්‍රියාවට නංවන ලෙස කියන්නේ විනිමය ඉතිරි කර ගැනීම සඳහා කරන උපායක් වශයෙනි.

ලංකාවේ කාබනික පොහොර ගැන පිලිපීනයේ පලමු පුවත්පතකට ලිපියක් ලියා තිබූ ලේඛකයෙක් පසුගිය මාසයේ කියා තිබුණේ කාබනික පොහොර ලංකාවේ කෘෂිකර්මාන්තය විනාශ කරන බවය.මේ පිළිබඳ අන්තර්ජාලයේ පලමු ලිපියක සඳහන් වුයේ පිලිපීන ආණ්ඩුව එම රටේ ගොවීන්ට ආධාර නොකළහොත් ගොවීන්ගේ ජීවන පැවැත්ම කඩාවැටීමට හැකි බවය.1980 ගණන් වල ඉන්දුනීසියාවේ සුහර්තෝ වැනි පාලකයින්ද වස නැති ගොවිතැන ක්‍රියාවට නැගීම සඳහා රසායනික වර්ග 57 තහනම් කරනු ලැබීය.මේ අත්හදාබැලීම් වලින් ඒවා සාර්ථක කරගැනීමට නොහැකි වූ බව පෙනී ගියේය.

## රාජ්‍ය තන්ත්‍රය මිලිටරිකරණය කිරීම

ගෝඨාභය රාජපක්ෂ පාලනය ධනපති පාලනයේ මරමස්ථාන මිල්ටරිකරණය කිරීමට තීන්දු කිරීම පිළිබඳ පසුගිය මාස ගණනාවක පුරා කතිකාවතක් ආරම්භ විය. විශේෂයෙන්ම අමාත්‍යාංශ ලේකම්වරුන් ලෙස විශ්‍රාමික හමුදා නිලධාරීන් පත්කර ඇති අතර රාජ්‍ය ආයතන, සංස්ථා හා දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙස ද හමුදා නිලධාරීන් පත්කරන ලදී.මෙම පත්වීම් නීත්‍යානුකූල කිරීම සඳහා 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට වගන්තියක් ද ඇතුලත් කිරීමට කටයුතු කළේය.රජයේ ආයතන සතුව පවතින බලතල විශේෂ ජනාධිපති කාර්ය සාධක බලකායාට පවරන ගැසට් නිවේදන ගණනාවක් නිකුත් වූ අතර එම විශේෂ කාර්ය සාධක බලකායන් වලින් වැඩි ප්‍රමාණයක් සමන්විත වී තිබෙන්නේ හමුදා නිලධාරීන්ගෙනි.ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක 25 සඳහා කොවිඩ් සම්බන්ධීකරණ නිලධාරීන් ද පත්කරන ලදී.මෙලෙස හමුදා නිලධාරීන් පත්කිරීමෙන් පෙනීයන්නේ ජනතාවගේ විරෝධතා වර්ධනය වී රට අස්ථාවර වන විට හමුදා යාන්ත්‍රණය මුල්කරගෙන එය මර්දනය කිරීමට කටයුතු කිරීමේ සූදානමක් තිබෙන බවය. මෙය වැඩ කරන ජනතාවගේ අයිතීන් දිනාගැනීමට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට මරණීය තර්ජනයකි. මෙය ලියන විට බොහෝ රටවල හමුදා ආණ්ඩු බිහිවීමේ ප්‍රවණතාවයක් දකින්නට ලැබේ. මෙවන් හමුදා පාලනයක් ලාංකේය සමාජය තුළ බිහිකිරීම පහසු කටයුත්තක් නොවන බව අපි පෙන්වා දෙමු.■



මහේෂ් දේවප්‍රිය

අසනි
සමාජවාදී එක්සත් ලංකාවක් උදෙසා පළවන පුවත් පත

පස් වන ජාත්‍යන්තරය ගොඩනගමු!



2/69, මෙල්ෆට්වත්ත,ගැමුණු පුර, කොතලවල, කඩුවෙල.
දුරකතන: 077 9053016 / 077 7035167
ඊමේල්: saranapala@hotmail.com
වෙබ්:socialistpartylk.lankanet.org


## මොළ හතේ අයවැය පුස්සක්..!

මෙදා උදුවප් මෙන්ම දුරුතු ශීතල ද, රට ම දවාලන මහා ගින්නක් බවට හැරී තිබේ. නත්තල ද ආවාට ගියාට වඩා වේගයෙන් ගෙවී ගිය සෙයකි. තවමත් පාස්කු ප්‍රහාරයේ චෝදනා - ප්‍රතිචෝදනා, අවලාද විනා කිතු උපතේ අරුතට සැබෑ අගයක් ලැබුණේ දැයි කීම උකහටය. අහස උසට නැගී ගෙන එන ආර්ථික අර්බුදය හමුවේ රටේ ජනතාව දහසකුත් එකක් අඩුපාඩු, අඟහිගකම් වලට මැදිව එදා වේල සරිකරගන්නා තැනට තල්ලු වී තිබේ. ආණ්ඩුවේ දෝෂ වලට ''මුවහමට තැලීම'' හැර වෙතත් විසඳුමක් උන්ට නැත. අන්තිමේ දී භූමිතෙල් පෝලිම දක්වා රටවැසියන් ගාල්කර තිබේ. ඒ හැම තැනකදීම ආණ්ඩුවට බැණ ගසනවාට වඩා වැඩියමක් සිදු නොවේ..!

විදේශ විනිමය හිඟය හේතුවෙන් ළදරු කිරිපිටිවල සිට අත්‍යවශ්‍ය ඖෂධ දක්වා ඇතිව තිබෙන හිඟය සමහර ජීවිත වලට මාරාන්තික වී තිබේ. ගෝඨාභය උන්නැහේ තම නිලධාරීන් කොට්ට මාරු කරන්නා සේ මාරු කළද. හිසේ ඇම්ම මඳකට හෝ සමනය නොවේ.

එහෙත් අපට සතුටුවන්නට එක් දෙයක් තිබේ. මැතිවරණ සමයේ ''උගත් බුද්ධිමත්'' යැයි කියාගත් වියත්මගේ ඇත්තන් තම වාසියට පොහෝට්ටුව දිනවන්නට කී – නොකී, කළ - නොකළ දෙයක් නොමැති තරම්. ඒ ජනතාව මුලාකර ඡන්ද ගරන්නටය. ඒ ශාපය උන්කරාම ගොස් ඇත. ඒ එකකුටවත් එකතැනක වැඩි දවසක් ඉදීමට නොලැබේ.

දැවුරුද්දකට ගිය තැන ''අනාගත්ත රජ්ජුරුවන් '' තම භාණ්ඩාගාරය භාරදුන්නේ මොළහතක් ඇතැයි කී එකකුට ය. උහුගෙන් ඉදිරිවසරේ අය-වැය, අන්තමේ ණය - වැයක් විය. ඒ කඩදාසිය අනුමතවන්නටත් පෙරම ඇමැත්තා පොල්කටුවක් ගෙන ඉන්දියාවට ගිගමන් ගියත්, ආවේ ඇදිවත පමණක් රැගෙනය. මේ තැනැත්තා ළඟ තිබෙනවා යැයි කී ප්‍රාතිහාර්යය කිසිවක් පහළ නොවුනි. පැරණි හොරෙකුට මහා බැංකුව බාර දී ඇත. මේ හොරාට ද ''වචන'' මිස රැඳෙන, දැනෙන දෙයක් නැති තරම්ය.

තවත් මායකට පමණ සෑහෙන විදේශ සංචිත ඉදිරියේ දෙගුණ තෙගුණ වන බැව් ඔහු කියයි. එහෙත් එසේ වැඩිවන්නේ හෝ වැඩි කරගන්නේ හෝ කෙසේදැයි ඔවුවත් නොදන්නා සේය. සමහර අවස්ථාවල පිළිතුරු දීගත නොහී මගහැර යනු රූප පෙට්ටිවලින් අපි දකිමු. රට ගිය තැන...!

ඒ අල්ල පනල්ලේ 2021 ද පිටුපස දොරින් පිටව ගියද, 2022 ජනතාවට යන - එන මං නැතිවන සෙයකි. විදේශ සංචිත ඇමරිකානු ඩොලර් බිලියන තුනක් වසර අවසානයෙ දී ලැබේ යැයි මහ බංකු අධිපති තෙමේ ප්‍රකාශ කළ ද එවැන්නක් තබා ඉන්ධන වියදමවත් රටට නැත.

"Quo Vadis" ? යනුවෙන් ලතින් භාෂාවෙන් කියැවෙන්නේ මෙතැනින් කොතැනට ද? යන්නයි.

අද අපට කියන්නට - අසන්නට සිදුව ඇත්තේ ද එය මැයි.

**"Quo Vadis -Sri Lanka ?"**

**රට මෙතිනින් කොතැනට ද..?**

# පවතින වම
## ආපෝහක නිශේධනයකට ලක් නොවන්නේ නම් ඊට
# අනාගතයක් නැත..!

වසන්ත දිසානායක

මම මීට කලකට පෙර මගේ මුහුණු පොතෙහි මෙවන් පෝස්ටුවක් පළ කෙළෙමි.

''අද දවසේ වාම හා ප්‍රගතිශීලී ව්‍යාපාරය සාර්ථකත්වයක් අත්කර ගැනීමට ඇති එකම මග වන්නේ එවන් සෑම පක්ෂයක්ම, සංවිධානයක්ම, කණ්ඩායමක්ම එකක් නෑර අපෝහක (දයලෙක්තික) නිෂේධයේ නිෂේධය ඔස්සේ ගමන් කිරීමෙන් පමණි, පමණක්ම ය.''

පත් කළ යුතු ය. එහෙත් ඊටත් වඩා අවධාරණයෙන් යුතුව සිය විවේචන ඉදිරිපත් විය යුතු තැනක් තිබේ. ඒ තමන්ම ගැන ය. වමේ අසාර්ථකත්වයේ කේන්ද්‍රීය හේතුව ඇත්තේ සිය අභ්‍යන්තරයේම බව අපේ වමේ ක්‍රියාකාරී බොහෝ දෙනාට වැටහීමක් තිබෙන බව පෙනෙන්නට නැත. වටහා ගැනීමේ උවමනාවක් තිබෙන බවක් පෙනෙන්නට ද නැත. මේ හැම එකක්ම පහේ තමන් මුහුණ දී සිටින අර්බුදය ගැන, එහි දිග පළල හා ගැඹුර ගැන කතා නොකරන තරම් ය. ඉඳහිට උඩින් පල්ලෙන් කතා කළත් පැවති හා පවතින අඩුපාඩු හා වැරදි අවංකව පිළිගැනීමට හා එසේ පිළිගෙන ඒවා නිවැරදිකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට ඇති නුසුදානම යි. කුඩා කණ්ඩායම් එකක් දෙකක් හැරුණු විට අන් කිසිදු පක්ෂයක් අන්‍යයන්ගේ මිස තමන්ගේ වැරදි අවංකව පිළිගන්නේවත් පිළිගෙන ඒවා නිවැරදි කර ගැනීමට පියවර ගන්නේවත් නැත. ස්වයං විවේචන කර නැතිවා නොවේ. එහෙත් ඇතැම් ඒවා යම් යම් පාර්ශවීය සත්‍යයන් අඩංගු කර ගත් පැහැදිලි ප්‍රබන්ධ ය. බොහොමයක් ඒවා වටේ යාම් හා මගහැර යාම් ය. ඇතැම් ඒවා සැබවින්ම කළ වැරදි විවේචනාත්මකව බලන්න ඕන, මෙසේ නොවීම අඩුවක්'' ආදී ස්වයං විවේචන ය. සැබවින්ම අඩුවැඩි වශයෙන් හැම වමේ පක්ෂයක්ම, කණ්ඩායමක්ම කරන්නේ සිදු වූ වැරදි සාධාරණීය කිරීමට හේතු සෙවීම ය. මේ පුරුද්දේ බලයෙන්, මේ දේශපාලන සංස්කෘතියෙන් තිර ලෙස කැඩී වෙන් නොවන්නේ නම් අසාර්ථකත්වය, යළි යළිත් අසාර්ථකත්වය අපේ වමේ සදාතනික උරුමය බවට පත් වෙනවා ඇත. වමට අනාගතයක් සහතික කර ගන්නට නම් වැරදි නිවැරදි කර ගැනීමේ මහා ව්‍යාපාරයක් පණ ගැන්විය යුතුම ය. ඒ

එහෙත් එය කිසිදු කතිකාවකට භාජනය වූයේ නැත. ඇතැම් විට එය ඇස නොගැසුනා හෝ එතරම් අවධානයකට ලක් නොවූවා හෝ වන්නට පුළුවන. සමහර විට එවැනි ප්‍රවේශයක් පවතින වමට අභියෝගයක් විය හැකි නිසා ඒ ගැන කතා නොකර සිටීම තමන්ගේ ශරීර සෞඛ්‍යයට හිතකර වේ යයි සිතා ඇතැම් කොටස් එය නිහඬතාවයෙන් යටපත් කර දැමීමට සිතුවා වන්නට ද පුළුවන. කෙසේ වේවා වමේ ප්‍රගතිය පිළිබඳ දෘෂ්ටිකෝණයෙන් ගත් කල මෙය අද තීරණාත්මක ලෙස මතු කළ යුත්තකැයි මම අදහස් කරමි. ලංකාවේ සෑම වාමාංශික පක්ෂයක්ම, කණ්ඩායමක්ම පුද්ගලයෙක්ම පාහේ ධනේශ්වර ක්‍රමයේ අර්බුදය ගැන, ධනේශ්වර පාලක පංතියේ අර්බුදය ගැන අපමණවත් කතා කරයි. එපමණක් නොව වමේ තමන් නොවන අනෙක් පාර්ශවවල අර්බුද ගැන වැරදි ගැන කතා කරයි. ඒවා කථා කළ යුතු ය. වෙනක් වැරදි මත, ප්‍රවනතාවන් ආදිය විවේචනය කර පරාජයට හැකිතාක් ඉක්මනින් ඒවා ගැන කතා කිරීමෙන් වැලකී සිටිති. නැතහොත් ඒවා මග හැරෙන ලෙස චේතනාත්මකව ක්‍රියා කරති. මේ ගති ලක්ෂණය අඩු වැඩි වශයෙන් ගත් කල අපේ වමේය කියන පක්ෂ, කණ්ඩායම්, පුද්ගලයන් යන හැම කොටසකගේම පාහේ නෛසර්ගික ලක්ෂණයකි. අප පිළිගැනීමට කැමති වුවත් නැතත් ධනේශ්වර ක්‍රමය සේම, ධනේශ්වර පක්ෂ හා පාලක කණ්ඩායම් සේම ඇතැම් විට ඒවාටත් වඩා බරපතල අන්දමේ අර්බුදයකට වම අද මුහුණ දී සිටින්නේය යන සත්‍යය අප පිළිගත යුතුම ය. එය එස් නොවන්නේ නම් එය අවසානයේ තමන්වම ද රවටා ගැනීමකි. අපේ වම පොදුවේ ගත් කල ස්වයං රැවටිල්ලට පෙම් බැඳ ගත්තකි. එකී ස්වයං රැවටිල්ලෙන් මිදී මේ අර්බුදය නිසි අයුරින් වටහා ගන්නා තෙක් හා එසේ වටහා ගෙන ගත යුතු අත්‍යවශ්‍ය පියවර ගන්නා තෙක් වමට අනාගතයක් නැති බව ඉතාමත්ම පැහැදිලි ය. වමේ අසාර්ථකත්වයේ කේන්ද්‍රීය හේතුව වන්නේ සිය අසාර්ථකත්වයට බලපා ඇති එය තුළම (වැරදි නොවේ ක්‍රියා ය !) බල කරන ලද තත්ත්වයන් තුළ කරන ලද ඒවා ය. නැතහොත් අතපසු වීම් ය. පාලකයන් වැරදි නොකළා නම් අපෙන් එවැනි දේ සිදුවන්නේ නැත. තවත් ස්වයං විවේචනයන් දෙස බැලුවොත් ඇත්තේ මෙවැනි ඒවා ය. ''අර සිද්ධිය අඩුපාඩු සහිතයි, මේ සිද්ධිය නිසා විශාල හානි පැමිණුනා, ඒ සිදුවීම් එසේ සිදු වීම ගැන ස්වයං ව්‍යාපාරය ඔස්සේ පවතින සමස්ත වමම නව වමක් මගින් නිෂේධනය කළ යුතුම ය. මන් ද වමේ සැබෑ ප්‍රගතියට විශාලතම බාධකය වී ඇත්තේ පවතින වමම නිසා ය. පවතින වම ප්‍රගතිශීලී වන්නේ හුදෙක් පවතින පාලනයන්ට සපේක්ෂව ගත් කල පමණි. ඇතැම් විශේෂයන් තිබිය හැක්කේ වුව ද පොදුවේ ගත් කල එය රටට අවශ්‍ය කරන වමට සාපේක්ෂව ප්‍රතිගාමී ය! ■

## අසනි කව් ගී..

### ශ්‍රී ලංකා වංක බැංකුව...

රටේ මහ බංකුවට
සල්ලි ඇච්චුන් ලු - සල්ලි ඇච්චුන් ලු
ගෙනා හැටියක් - ලැබුණු හැටියක්
කව්රුවත් ම දන්නේ නැතිලු..
දන්නවද මේ කව්රුවත්..?

අපි කන්නේ තණ කොළද..?
එත් නැතිනම් දත්මිටිද - දත්මිටි
තවත් කොයි කාලයක්
මේ අවුල පවතියි ද..?

එක රැයෙන්වළවලා
සක්වලට එළවලා..
ජනමතය ගොඩ නගමු..!
ජනමතය ගොඩ නගමු..!

ඇහැළියගොඩ, අඟරුවාමුල්ල, පදිංචි දේව මහින්දදාස වන මා විසින් ඇහැළියගොඩ, මිහිඳු ග්‍රැෆික්ස් ආයතනයේ මුද්‍රණය කරන ලදි.